ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව - 2019

-----------------------------------------------

## 1.1 තත්ත්වාගණනය කළ මතය

----------------------------

ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ (“සංස්ථාව”) සහ එහි පරිපාලිතයේ ("සමූහය") 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය ,හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2019 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, සංස්ථාවේ සහ සමූහයේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

------------------------------------------

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්

--------------------------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සංස්ථාව සහ සමූහය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සංස්ථාව ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සංස්ථාවේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සංස්ථාවේ සහ සමූහයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

**2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, සංස්ථාව වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.**

**1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)**

**------------------------------------------------------------------------------------------------**

**සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.**

**මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,**

- **වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.**

- **අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස සමාගමේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.**

- **කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම් වල සාධාරණත්වය ඇගයීම.**

- **සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.**

- **හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.**

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ සංස්ථාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ සංස්ථාවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, සංස්ථාව සහ එහි සමූහය ක්‍රියා කර ඇති බව,

- සංස්ථාව සහ සමූහය සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සංස්ථාව සහ සමූහය සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

**1.5** මූල්‍ය ප්‍රකාශන

**1.5.1** ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| **(අ.) <u>ශ්‍රී.ලං.ගි.ප්‍ර 16 හි 36 වන ඡේද - දේපළ, පිරියත හා උපකරණ</u>** | | |
| දළ වශයෙන් රු.මිලියන **5,098.89** ක් පිරිවැය වූ සම්පූර්ණයෙන් ක්ෂය කළ වත්කම් සංස්ථාව විසින් අඛණ්ඩව භාවිතා කර තිබුණු අතර එම වත්කම්වල ඵලදායි ජීවකාලය නැවත තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි. එමෙන්ම සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට සංස්ථාව සතු ඉඩම් **22** ක් ප්‍රත්‍යාගණනය කර නොතිබුණි බව විගණන නියැදි පරීක්ෂාවේදී අනාවරණය වූ අතර මූල්‍ය ප්‍රකාශනවල එම ඉඩම් සැලකිය යුතු අඩු වටිනාකමකින් දක්වා තිබුණි. | ඉඩම් **11** ක අයිතිය සංස්ථාව සතුව නොපවතින අතර, එම ඉඩම්වල අයිතිය ලබා ගැනීම සඳහා නීති අංශය විසින් අවශ්‍ය පියවර ගනිමින් සිටී. අයිතිය තහවුරු කර ගැනීමෙන් අනතුරුව ප්‍රත්‍යාගණනය කර ගිණුම්කරණ ගැලපුම් සිදු කරනු ලැබේ. | එය ප්‍රමිතියට අනුකූල විය යුතු අතර නිසි වාර්තා තබා ගත යුතුය |
| **(ආ.) <u>එස්එල්එෆ්ආර්එස් 16 හි 47 වන ඡේද- කල්බදු</u>** | | |
| කල්බදු සඳහා සමාගම් තනි ගිණුම්කරණ ආකෘතියක් අනුගමනය කළ යුතු අතර මෙහෙයුම් කල්බදු ශේෂ පත්‍රයේ වෙනත් වත්කම් වලින් වෙන් වෙන් වශයෙන් භාවිතා කිරීමේ අයිතිය ලෙස හෝ සටහන් වල වෙන වෙනම අනාවරණය කළ යුතුය. ඒ හා සමානව, කල්බදු වගකීම් ශේෂ පත්‍රයේ ඇති වෙනත් වගකීම් වලින් වෙන වෙනම ඉදිරිපත් කළ යුතුය. කෙසේ වෙතත්, සංස්ථාව එවැනි විධිවිධානවලට අනුකූල වී නොතිබුණි. විගණනයට ලබා දී ඇති තොරතුරුවලට අනුව, **2019** වර්ෂය සඳහා සමස්ත මෙහෙයුම් බදු කුලී වියදම රුපියල් මිලියන **43.12** කි. | ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ දේපල පිරියත සහ උපකරණවල මූල්‍ය කල්බදු වත්කම් නොමැත. එබැවින් මූල්‍ය ප්‍රකාශනවල කිසිදු ගැලපීමක් නොමැත. කෙසේ වෙතත්, එළඹෙන මූල්‍ය ප්‍රකාශනවලදී වර්ෂය තුළ ගෙවා ඇති බදු කුලිය අනාවරණය කිරීමට පියවර ගනු ලැබේ. | ප්‍රමිතියට අනුකූල විය යුතු අතර නිසි වාර්තා තබා ගත යුතුයි. |

## 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) සංස්ථාවේ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනවලට අනුව, අන්තර් සමාගම් ශේෂ ලෙස රු. මිලියන 3,845.56 ක් ගිණුම් වලින් ඉවත් කර තිබුණු නමුත් විගණනය කරන ලද CPSTLහි මූල්‍ය ප්‍රකාශනවලට අනුව අන්තර් සමාගම් ශේෂ ලෙස දක්වා තිබුනේ රු. මිලියන 6,248.78 ක් ලෙස වේ. ඒ අනුව, රු. මිලියන **2,403.22**ක් ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනවල වෙළඳ හා වෙනත් ලැබිය යුතු යටතේ සංස්ථාවෙන් ලැබිය යුතු යැයි වැරදි ලෙස දක්වා තිබුණි. තවද, සමාලෝචිත වර්ෂය අවසානය වන විට එම ශේෂයට රු.මිලියන **1,029.13**ක නොගැලපූ මාර්ගස්ථ මුදල් ඇතුලත්ව තිබුණි. | - | සියලුම නොසැසඳුණු ශේෂයන් නිරවුල් කර ගැනීමට අවශ්‍ය කඩිනම් ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ආ) ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනය පිළියෙළ කිරීමේදී යොදාගත් පරිපාලිතයේ සංඛ්‍යා හා පරිපාලිතයේ (CPSTL) විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශනවල සඳහන් සංඛ්‍යා අතර වෙනස්කම් නිරීක්ෂණය වූ අතර මූල්‍ය වත්කම් හා පරිපාලන වියදම් රු. මිලියන **9.78**කින්, විලම්බිත බදු රු. මිලියන **2.74**කින්, වෙළඳ සහ වෙනත් ගෙවිය යුතු රු. මිලියන **54.97**කින්, මෙහෙයුම් ආදායම රු. මිලියන **76.35**කින් හා ආදායම් බදු වියදම රු. මිලියන **24.12**කින් වෙනස් වී තිබුණි. | - | නොසැසඳුණු ශේෂයන් තහවුරු කර ගැනීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගතයුතු අතර ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී නිවැරදි සංඛ්‍යා යොදාගත යුතුය. |
| (ඇ) සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශනවල සඳහන් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අනුව, "විදේශ මුදල්වලින් නම් කර ඇති මුදල් වත්කම් වාර්තා කිරීමේ දිනයේ දී විනිමය තීන්දු කිරීමේ ක්‍රියාකාරී මුදල් අනුපාතයට නැවත පරිවර්තනය කරනු ලබන අතර සියලු වෙනස්කම් ආදායම් ප්‍රකාශයට ගලපනු ලැබේ. ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ සියලුම ගුවන් සේවා ගනුදෙනුකරුවන් විදේශ මුදල්වලින් වාර්තා කරයි". කෙසේවෙතත්, විදේශීය මුදල්වලින් නම් කරන ලද මුදල් වත්කම් වාර්තා කිරීමේ දිනයේ දී විනිමය තීන්දු කිරීමේ ක්‍රියාකාරී මුදල් අනුපාතයට නැවත පරිවර්තනය කර නොතිබුණු අතර , එහි ප්‍රතිපලයක් ලෙස ගුවන් සේවා ගනුදෙනුකරුවන් හා සමාලෝචිත වර්ෂයේ ලාභය රු.මිලියන 910.8 කින් අඩුවෙන් දක්වා ඇති බව නිරීක්ෂණය විය. | ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ ගිණුම්කරණ ප්‍රතිපත්තියට අනුව, වර්ෂය අවසාන දිනට විනිමය අනුපාතය ලෙස, එක්සත් ජනපද ඩොලරය (ක්‍රියාකාරී මුදල්) රුපියල්වලට පරිවර්තනය කිරීමේ අනුපාතය ලෙස සැලකිල්ලට ගනී. නමුත් රු.මිලියන 910.8 ක වෙනසක් සිදුවී ඇත්තේ විකුණුම් අනුපාතය අවසාන අනුපාතය ලෙස භාවිතා කිරීම හේතුවෙනි. | සංස්ථාවේ ගිණුම්කරණ ප්‍රමිත හා ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අනුකූල විය යුතුය. |

| | | |
|---|---|---|
| **(ඇ) මාසික උපයෝගිතා ගාස්තු එකතු කිරීම (MUF)**<br>2013 ඔක්තෝබර් 29 දින ගනු ලැබූ අධ්‍යක්ෂ මණ්ඩල තීරණ අංක 38/1140 අනුව, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2014 ජනවාරි 01 දින සිට සංස්ථාව සතු බෙදාහරින්නන්ගේ (CODO) පිරවුම්හල් සහ භාණ්ඩාගාරයට අයත් බෙදාහරින්නන්ගේ (TODO) පිරවුම්හල් වලින් මාසික උපයෝගිතා ගාස්තුවක් අයකර ගැනීමට අනුමැතිය ලබා දී තිබුණි.කෙසේ වෙතත්, මෙම තීරණය සම්පූර්ණයෙන් ක්‍රියාත්මක වී නොතිබුණු අතර MUF අයකරගෙන තිබුනේ අලෙවිකරුවන් 248 දෙනෙකු අතරින් 11 දෙනෙකුගෙන් පමණි. එමනිසා, 2014 වර්ෂයේ සිට සංස්ථාවට වාර්ෂිකව රු. මිලියන 300 ට වඩා අහිමි වී තිබුණු අතර දළ වශයෙන් 2014 සිට 2019 දක්වා කාලපරිච්ඡේදය තුළ සංස්ථාවට රු. මිලියන 1,900 කට වඩා අලාභයක් සිදු වී තිබුණි. පසුගිය විගණන වාර්තාවල මේ සම්බන්ධයෙන් දක්වා තිබුණද, ඉහත සඳහන් කළ පරිදි කාණ්ඩ දෙකෙහිම සියලුම බෙදාහරින්නන්ගෙන් මාසික උපයෝගිතා ගාස්තු අය කර ගැනීමට සංස්ථාව විසින් ඵලදායී පියවර ගෙන නොතිබුණි.එමෙන්ම, මේ සම්බන්ධයෙන් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල කිසිදු ගැලපීමක් සිදුකර නොතිබුණි. | සියළුම CODO බෙදාහරින්නන් අතර මෙම ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා 20**20.07.03** දිනැති 3/1214 අංක දරන අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාව 2018 දී ඉදිරිපත් කර ඇත. නමුත් ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලය අලෙවිකරණය විසින් කරන ලද නිර්දේශයන්ට එකඟ වී නැති අතර පෙර ගෙවීමේ තීරණයෙහි අපැහැදිලි බව සහ පරස්පර විරෝධී ස්වභාවය සඳහන් කරමින් මෙම ගෙවීම් පිළිබඳ සියලු තීරණ අවලංගු වී ගියේය. මෙම තීරණ අවලංගු වී යන අතරම, CODO අලෙවිසැල්වල අමතර ගාස්තුව වෙනස් කිරීම සඳහා විකල්ප යාන්ත්‍රණයක් නිර්දේශ කර තිබුණි. නව ක්‍රමය ක්‍රියාත්මක කිරීම ද දුෂ්කර විය. එබැවින් 2020 දී නව තීරණ ක්‍රියාත්මක කිරීමේදී ඇති වූ දුෂ්කරතා හා හේතු දක්වමින් නව මණ්ඩල පත්‍රිකාවක් ඉදිරිපත් කල අතර, MUF සඳහා ස්ථිර පදනමක් ක්‍රියාත්මක නොවන බවට මණ්ඩලය එකඟ වූ අතර සංස්ථාවේ ප්‍රතිපත්තිමය තීරණ මත පදනම්ව එය ක්‍රියාත්මක කර නොමැත. | වගකිව යුතු පාර්ශ්වයන්ගෙන් පාඩුව අයකර ගැනීම සඳහා සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය. වගකිවයුතු පාර්ශවයන් විසින් අධ්‍යක්ෂ මණ්ඩලයේ තීරණ ක්‍රියාත්මක කරනු ලබන බවට වග බලා ගත යුතු අතර එසේ නොවේ නම් අවශ්‍ය පියවර ගත යුතුය. |
| (ඉ) එකතුව රු. මිලියන **1,941.76**ක් වූ සෘණ බැංකු ශේෂ තුනක් ජංගම වගකීම් යටතේ පෙන්වනු වෙනුවට ජංගම වත්කම් යටතේ ඇති බැංකු ශේෂයන්ගෙන් කපාහැර තිබුණි. | 2019.12.31 දිනට ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට කිසිදු අයිරා බැංකු ශේෂයක් නොමැත. ඛනිජ තෙල් නීතිගත සංස්ථාව විසින් ආයෝජන පොලියෙන් ලැබෙන දෛනික අතිරික්ත මුදල් ආයෝජනය කිරීම සඳහා ලංකා බැංකුවේ සහ මහජන බැංකුවේ මුදල් වෙළඳපොළ ගිණුම් විවෘත කර තිබේ. මෙම මුදල් වෙළඳපොළ ගිණුම් වෙනත් ජංගම ගිණුම් සමඟ සම්බන්ධ වී ඇති අතර මුදල් ජංගම ගිණුමේ නොමැති නම්, අවශ්‍ය මුදල ස්වයංක්‍රීයව ජංගම ගිණුම වෙත මාරු කරනු ලැබේ. ඒ අනුව මුදල් වෙළෙඳපොළ ගිණුමේ අරමුදල් ඇති බැවින් බැංකු ගිණුම්වල අයිරා කිසිවක් නොමැත. තවද, 2019 දී ඛනිජ තෙල් නීතිගත සංස්ථාව කිසිදු අයිරා පොළියක් දරා නොමැත. | ධනාත්මක හා සෘණාත්මක බැංකු ශේෂයන් මූල්‍ය ප්‍රකාශනවල වෙන වෙනම පෙන්විය යුතුය. |

**1.5.3** නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

| විෂයය | මූල්‍ය ප්‍රකාශන අනුව වටිනාකම | අනුරූපී වාර්තා අනුව වටිනාකම | වෙනස | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | | |
| (අ) ලංකා විදුලි බල මණ්ඩලයෙන් ලැබිය යුතු ශේෂය | **785.3** | **753.6** | **31.78** | ලං.වි.ම. වෙතින් ලැබුණු ශේෂ සනාථන අනුව, රු. මිලියන **753.6** ක ශේෂයක් ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට ගෙවිය යුතු බව සනාථ කර තිබේ. දැනටමත් එවා ඇති සැසඳුම් විස්තරයේ රුපියල් මිලියන **31.8** ක ශේෂ වෙනස පැහැදිලි කර ඇත. | නොසැසඳුණු ශේෂයන් නිවැරදි කිරීමට කඩිනම් පියවර ගත යුතුය. |
| (ආ) දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ගෙවිය යුතු ශේෂය | | | | | |
| (i) ජාතිය ගොඩනැගීමේ බදු (NBT) | 3,242.5 | 707.9 | 2,534.6 | ගෙවීම් / ගැලපීම්/ ගැටලු යන කරුණු කිහිපයක් සලකා බැලීමෙන් තොරව ගෙවිය යුතු ශේෂයන් දේශීය අදායම් දෙපාර්තමේන්තුව විසින් සනාථ කිරීම නිසා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව සහ දේශීය අදායම් දෙපාර්තමේන්තුව අතර වෙනස පැන නැගී ඇත. | හිඟ මුදල් කඩිනමින් පියවීමට අවශ්‍ය පියවර ගත යුතුය |
| (ii) අදායම් බදු | 2,950.8 | 16,268 | 13,317.2 | | |
| (iii) උපයන විට ගෙවීම් බදු(PAYE ) | 0 | 33.5 | 33.5 | **2019** දෙසැම්බර් වැටුප සහ වාර්ෂික බෝනස් මුදල මත දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ගෙවන ලද උපයන විට ගෙවීම් බද්ද රු. **51,644,826.96** කි. මෙය **2019/12/31** දිනට ගෙවිය යුතු අතර එය ගෙවා ඇත්තේ **2020/01/13** දින ය. රුපියල්. මිලියන **2.5** ක් නියෝජනය කරන්නේ විශ්‍රාමික පාරිතෝෂිකය සඳහා රඳවා තබා ඇති රඳවාගැනීමේ බදු(WHT) ය. මෙය දේශීය | හිඟ මුදල් කඩිනමින් පියවීමට අවශ්‍ය පියවර ගත යුතුය |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | | | ආදායම් දෙපාර්තමේන්තුවට (IRD) හෝ සේවකයාට ගෙවිය යුතුය. ඛනිජ තෙල් නීතිගත සංස්ථාව, දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙතින් නිෂ්කාශනය ලැබෙන තෙක් පාරිතෝෂිකයෙන් කොටසක් රඳවා ගනී. නිෂ්කාශනය ලබා ගත් පසු මෙම වගකීම පියවනු ලැබේ | |
| (ඇ) ගෙවිය යුතු නැව් පමාකුලී | 337.24 | 363.12 | 25.89 | අදහස් දක්වා නොමැත | හිඟ මුදල් සමථයකට පත් කර ගැනීමට හා පියවීමට කඩිනම් ක්‍රියාමාර්ග ගත යුතුය. |

## 1.5.4 සංවිධානයේ අඛණ්ඩ පැවැත්ම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ බදු පසු ශුද්ධ අලාභය රු.මිලියන **11,856.6** ක් සහ මුළු විස්තීර්ණ වියදම රු.මිලියන **11,751**ක් **2019** වර්ෂය සඳහා සංස්ථාවේ මෙහෙයුම් කටයුතුවලින් ජනිතවී තිබූ අතර සමාලෝචිත වර්ෂයේ සංස්ථාවේ රු. මිලියන **293,213** ක සෘණ ශුද්ධ වත්කම් තත්වය නිරූපණය විය. විනිමය අනුපාතයේ සෘණාත්මක විචලතාවය සහ නුසුදුසු මිලකරණ ප්‍රතිපත්තිය හා හෙජිං ගනුදෙනු හේතුවෙන් ඇති වූ අධික අලාභයන්, මෙම සමුච්චිත අලාභය ඇති වීමට ප්‍රධාන වශයෙන් බලපා තිබුණි. මේ අනුව, රජයේ මුල්‍ය සහයක් නොමැතිව සංස්ථාවේ අඛණ්ඩ පැවැත්ම ගැටලු සහගතය. | අදහස් දක්වා නොමැත | සංස්ථාවේ සෘණ ශුද්ධ වත්කම් තත්ත්වය අඩු කර ගැනීම සඳහා සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය. |

**1.5.5 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම**

| විෂය | මුදල | නොසැපයූ විගණන සාක්ෂි | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| | රු.මිලියන | | | |
| (අ)දේශීය ආදායම් දෙපාර්තමේන්තුවෙන් සහ ශ්‍රී ලංකා රේගුවෙන් ලැබිය යුතු ශේෂය | **1,135.8** | බදු වාර්තා , ඉන්වොයිසි සහ අනෙකුත් අදාළ වාර්තා | මෙම මුදල අයකර ගැනීමේ හැකියාව පරීක්ෂා කර 2020 මූල්‍ය වර්ෂයේ දී මූල්‍ය ප්‍රකාශනවල අවශ්‍ය සටහන් ඇතුළත් කරනු ලැබේ. | මෙම වටිනාකම අයකර ගැනීමට / පියවීමට කඩිනම් පියවර ගත යුතුය. |
| (ආ) පවරා ඇති දේපල | **1.02** | වත්කම්වල විස්තර හා අදාල අනෙකුත් ලේඛන | මෙය සංස්ථාගත කරන අවස්ථාවේ දී තෙල් සමාගම් වෙතින් පවරා ගත් ස්ථාවර වත්කම්වල වටිනාකම වේ. | සංස්ථා දේපල පිළිබඳ නිසි වාර්තා තබා ගැනීමට සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ඇ) ගෙවිය යුතු ශේෂ | **317.17** | ශේෂ තහවුරු කිරීම් සහ වෙනත් අදාළ ලේඛන | 2020 මුදල් වර්ෂයේ නිවැරදි ශේෂයන් ඉදිරිපත් කිරීම සඳහා අවශ්‍ය පියවර ගෙන ඇත. | ගණුදෙනු පිළිබඳ නිසි හා යාවත්කාලීන වාර්තා තබා ගැනීමට සුදුසු ක්‍රියාමාර්ග ගතයුතුය. |
| (ඈ)දේශීය ආදායම් දෙපාර්තමේන්තුවන් ලැබිය යුතු වැට් බදු **(VAT)** | 565.2 | බදු වාර්තා , ඉන්වොයිසි සහ අනෙකුත් අදාළ වාර්තා | මෙම වටිනාකම අයකර ගැනීමේ හැකියාව පරීක්ෂා කර 2020 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල අවශ්‍ය ගැලපීම් ඇතුළත් කරනු ලැබේ. | ගණුදෙනු පිළිබඳ නිසි හා යාවත්කාලීන වාර්තා තබා ගැනීමට සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය |
| (ඉ)දේශීය ආදායම් දෙපාර්තමේන්තුවෙන් ලැබිය යුතු ශේෂය | 376 | බදු වාර්තා, ඉන්වොයිසි සහ අදාළ වෙනත් ලේඛන | මෙම ගැලපීම 1998 වර්ෂයේ සිදුකර ඇති අතර මේ සඳහා සැසඳුමක් සකස් කරමින් පවතී. | ගණුදෙනු පිළිබඳ නිසි හා යාවත්කාලීන වාර්තා තබා ගැනීමට සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ඊ) වෙළඳ හා වෙනත් ගෙවිය යුතු හර ශේෂයන් | 749.66 | ශේෂ සනාථන ලිපි හා අදාළ වෙනත් ලේඛන | 2020 මුදල් වර්ෂයේ නිවැරදි ශේෂයන් ඉදිරිපත් කිරීම සඳහා අවශ්‍ය පියවර ගෙන ඇත. | ගණුදෙනු පිළිබඳ නිසි හා යාවත්කාලීන වාර්තා තබා ගැනීමට සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (උ) මාර්ගස්ථ මුදල් හා මාර්ගස්ථ තොග | 8.46 | ශේෂ සනාථන ලිපි හා අදාළ වෙනත් ලේඛන | ඛනිජ තෙල් නීතිගත සංස්ථාව විසින් ශේෂ සැසඳුම සකස් කරමින් සිටින අතර ශේෂය තහවුරු කර ගැනීමෙන් අනතුරුව අවශ්‍ය ක්‍රියාමාර්ග ගනු ලැබේ. | සෑම ගනුදෙනුවක් සඳහාම නිසි හා යාවත්කාලීන වාර්තා තබා ගැනීමට සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ඌ) පෙරගෙවුම් බැර ශේෂය | 32.82 | ශේෂ සනාථන ලිපි හා සහ අදාළ වෙනත් ලේඛන | අදාළ අදහස් දැක්වීමක් සිදුකර නොමැත. | මෙම වටිනාකම තහවුරු කර ගැනීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගතයුතුයි. |
| (එ)පෙරගෙවුම් හර ශේෂය | 1.02 | නඩු විභාග වෙමින් පවතීද නැද්ද යන්න පිළිබඳ තොරතුරු ලබා දී නොමැත | අදාළ අදහස් දැක්වීමක් සිදුකර නොමැත. | සෑම ගනුදෙනුවක් සඳහාම නිසි හා යාවත්කාලීන වාර්තා තබා ගැනීමට සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ඒ)නැවත ගෙවිය යුතු තැන්පතු | 110.8 | ශේෂ සනාථ කර ගැනීම සඳහා අවශ්‍ය ලේඛන | ගණුදෙනුකරුවන් ආපසු ඉල්ලා සිටින තෙක් තැන්පතු රඳවා තබා ගත යුතුවේ. | සෑම ගනුදෙනුවක් සඳහාම නිසි හා යාවත්කාලීන වාර්තා තබා ගැනීමට සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය. |

### 1.5.6 පරිපාලිත සමාගමේ මූල්‍ය ප්‍රකාශන මත විගණන මතය

සමාලෝචිත වර්ෂය සඳහා පහත සඳහන් නිරීක්ෂණ හේතු කොටගෙන සංස්ථාව සහ සමූහයේ අනුරූපී ශේෂයන් සහ ගනුදෙනු සටහන් සමග එකඟ නොවීම මත මා විසින් ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගමේ (CPSTL) මූල්‍ය ප්‍රකාශන මත මතයක් ප්‍රකාශ නොකරන ලදී.

| විගණන නිරීක්ෂණ | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) දේපල, පිරියත සහ උපකරණ පිළිබඳ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතියේ (LKAS 16) 51 වන ඡේදයට අනුව, වත්කම්වල ප්‍රයෝජනවත් ආයු කාලය අවම වශයෙන් සෑම මූල්‍ය වර්ෂයකදීම සමාලෝචනය කළ යුතු අතර අපේක්ෂිත ප්‍රතිලාභ කලින් ඇස්තමේන්තු වලට වඩා වෙනස් නම්, වෙනස්කම් LKAS 08 ට අනුකූලව ගිණුම්ගත කළ යුතුය. කෙසේ වෙතත්, රු. මිලියන 6,074 ක් වූ සම්පූර්ණයෙන් ක්ෂය වූ දේපල, පිරියත සහ උපකරණවල ප්‍රයෝජනවත් ආයු කාලය නැවත සමාලෝචනය කර ගිණුම්ගත නොකර සමාගම විසින් අඛණ්ඩව භාවිතා කරනු ලබයි.තවද, සමාගම ආරම්භක වර්ෂය වන 2003 වර්ෂයේ සිටම සිය වත්කම් තක්සේරු කර නොමැත. | ICASL හි සහය ඇතිව සම්පූර්ණයෙන්ම ක්ෂය කල වත්කම් නැවත තක්සේරු කිරීමට එකඟ වේ. | සමාගම ප්‍රමිතියේ අවශ්‍යතාවයට අනුකූල විය යුතු අතර ඒ අනුව වත්කම් නැවත ඇගයීමට ලක් කළ යුතුය. |

| | | |
|---|---|---|
| **(ආ) අන්තර් සමාගම් ශේෂයන්** ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව (CPC) සහ ලංකා ඉන්දියානු තෙල් සමාගම (LIOC) අතර අන්තර් සමාගම් ශේෂයන්හි නිරවද්‍යතාවය, පැවැත්ම, තක්සේරු කිරීම සහ සම්පූර්ණත්වය පහත සඳහන් හේතු නිසා විගණනයේදී තහවුරු කර ගැනීමට නොහැකිවිය. | | |
| **(i)** විගණනයට ලද තොරතුරුවලට අනුව, Exim බැංකුවේ ණය නිරවුල් කිරීම සලකා බලා ප්‍රතිපාදන ගාස්තු වල ඇතුලත්ව තිබූ ණය පොලී කොටස ලීටරයට ශත 13 ක් ඉවත් කිරීම සඳහා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවෙන් ලැබියයුතු මුදල රු.මිලියන 1,173ක් ඔවුන්ගේ ගිණුම් වලින් කපා හරින ලදී. කෙසේ වෙතත්, මේ සම්බන්ධයෙන් සමාගම කිසිම නිගමනයකට එළඹී නොමැති අතර හානිකරණය සඳහා වූ ප්‍රතිපාදනයක් ද සිදුකර නොමැත. එබැවින්, මෙම ලැබිය යුතු ශේෂය නැවත අයකර ගැනීමේ හැකියාව පිළිබඳව විගණනයේදී සැක සහිත වේ. | ප්‍රතිදාන ගාස්තු වල පොලී සංරචකය ඉවත් කිරීම සඳහා පවත්නා ත්‍රි-පාර්ශවීය ගිවිසුම සලකා බැලීමකින් තොරව සහ ලංකා ඛනිජ තෙල් ගබඩා පර්යන්ත සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය දැනුවත් කිරීමකින් තොරව ගෙවිය යුතු මුදල ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව විසින් කපා හැර තිබේ. ඛනිජ තෙල් නීතිගත සංස්ථාව විසින් ලංකා ඛනිජ තෙල් ගබඩා පර්යන්ත සමාගමේ කළමනාකරණය පිළිබඳව සලකා බැලීමකින් තොරව, ප්‍රතිදාන ගාස්තු වල පොලී සංරචකය ඉවත් කිරීමේ තීරණය වෙත එළඹ ඇත. මෙම ගැටලුව නිරාකරණය කර ගැනීම සඳහා ආයතන දෙකෙහිම අධ්‍යක්ෂ මණ්ඩලයේ සහභාගිත්වය ඇතිව ආයතයන්හි කළමනාකාරිත්වයන් (ඛනිජ තෙල් නීතිගත සංස්ථාව සහ ලංකා ඛනිජ තෙල් ගබඩා පර්යන්ත සමාගම්හි මූල්‍ය අංශය) අතර බොහෝ සාකච්ඡා සිදුවී තිබුණි. 2019 දෙසැම්බර් 31 දින වන විට ඉහත අයකර ගත හැකි ශේෂය සම්බන්ධයෙන් හානිකරණය සඳහා වූ ප්‍රතිපාදනයක් සිදු කර නොමැත. | ඛනිජ තෙල් නීතිගත සංස්ථාව සහ ලංකා ඉන්දියානු තෙල් සමාගම (LIOC) සමඟ එවැනි ණයක් ලබා ගැනීමේ අපේක්ෂාව සහ නීත්‍යානුකූලභාවය සැලකිල්ලට ගනිමින් එය සමථයකට පත් විය යුතුය. |
| **(ii)** සමාගමේ මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචනයට භාජනය වූ වර්ෂය අවසානයේදී ඛනිජ තෙල් නීතිගත සංස්ථාවෙන් ලැබිය යුතු මුදල රුපියල් මිලියන 6,248.87 කි. කෙසේ වෙතත්, ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශනවලට අනුව සමාලෝචනයට භාජනය වූ වර්ෂය අවසානයේ සමාගමට ගෙවිය යුතු මුදල රු. මිලියන 4,625.74 කි. (රු. මිලියන 1,029.45 ක මාර්ගස්ථ මුදල් අඩු කිරීමට පෙර) එබැවින්, එම ශේෂ දෙක අතර එකඟ නොවූ රුපියල් මිලියන 1,623.13 ක වෙනසක් නිරීක්ෂණය විය. | ඛනිජ තෙල් නීතිගත සංස්ථාව සහ ලංකා ඛනිජ තෙල් ගබඩා පර්යන්ත සමාගම අතර 2019 දෙසැම්බර් 31 දින වන විට ලැබිය යුතු හා ගෙවිය යුතු හිඟ ශේෂයන් අතර රු. මිලියන 2,652.58 ක වෙනසක් ඔබට අනුව පැවතියද, අදාළ කාලපරිච්ඡේදවල එම ශේෂයන් අතර කිසිදු වෙනසක් නොමැති බව අප හට නිරීක්ෂණය විය. | සියලු එකඟ නොවූ ශේෂයන් කල්තියා ඉවත් කිරීමට සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය.. |

| | | |
|---|---|---|
| **(iii)** ලංකා ඉන්දියානු තෙල් සමාගම වෙතින් ලද ශේෂ තහවුරු කිරීම්වලට අනුව, සමාගමට ගෙවිය යුතු මුදල රු. මිලියන **370.9** කි. කෙසේවෙතත්, සමාගමේ මූල්‍ය ප්‍රකාශනවලට අනුව අදාළ මුදල රු. මිලියන **376.0** කි. එබැවින්, එම ශේෂ දෙක අතර රුපියල් මිලියන **5.1** ක එකඟ නොවූ වෙනසක් නිරීක්ෂණය විය. | මෙම වෙනස නිරාකරණය කිරීම සඳහා සාකච්ඡා පැවැත්වෙමින් තිබේ. | සියලු එකඟ නොවූ ශේෂයන් කල්තියා ඉවත් කිරීමට සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය.. |
| (ඇ) **1,300** කට වඩා වැඩි ඉන්වෙන්ටරි අයිතමයන් සැලකිය යුතු ප්‍රමාණයක වටිනාකම් දිගුකාලීනව ව්‍යාපාර සම්පත් කළමනාකරණ පද්ධතියට **(ERP)** එනම්, **SAP** පද්ධතියට ඇතුළත් කිරීමකින් තොරව ප්‍රමාණයන් පමණක් ඇතුලත් කර ඇත. එබැවින්, සමාලෝචනයට භාජනය වූ වර්ෂය අවසානයේදී මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ දැක්වෙන රුපියල් මිලියන **676** ක් වටිනා තොග අයිතමවල නිරවද්‍යතාවය, තක්සේරු කිරීම සහ සම්පූර්ණත්වය සම්බන්ධව විගණනයේදී විශ්වාසය තැබිය නොහැක. | සුන්බුන් සහ භාවිතා කරන ලද අයිතම (උදා: පැරණි පුවත්පත්, පාවිච්චි කළ ටයර් ආදිය) සඳහා පවත්නා ක්‍රියා පටිපාටිය අනුව, සියළුම සුන්බුන් සහ භාවිතා කරන ලද අයිතම ශුන්‍ය අගයක් සහිතව සටහන් කිරීම අනිවාර්ය වේ. අයිතමයන් සොරා ගැනීම අවම කිරීමට මෙන්ම සොයාගැනීම පහසු කිරීම සඳහා මෙය වැදගත් අභ්‍යන්තර පාලන යාන්ත්‍රණයකි. **2019** දෙසැම්බර් **31** වන විට මුළු ශුන්‍ය වටිනාකම් අයිතම ප්‍රමාණය **1,369** ක් වන අතර ඒවායින් **1,336** ක අයිතම "භාවිතා කළ අයිතම-සීරීම්" වන අතර, නැවත සකස් කළ යුතු අයිතම **19** ක් පමණක් පවතී. එමෙන්ම, අයිතම **14** ක් **3** වන කාණ්ඩයට අයත් වේ. | සියලුම ඉන්වෙන්ටරි අයිතම නිසි ලෙස අගය කළ යුතු අතර ඒ අනුව ගිණුම්ගත කළ යුතුය. සමාගමේ තොග පාලනය සම්බන්ධයෙන් නිසි වාර්තා තැබීමේ සහ පාලනය කිරීමේ යාන්ත්‍රණයක් හඳුන්වා දිය යුතුය. |
| (ඇ) **LKAS 08** ට පටහැනිව, එකතුව රුපියල් මිලියන **357.7**ක් වූ ටග් බෝට් ගාස්තු සමාලෝචනයට භාජනය වූ වර්ෂය තුලදී ගිණුම් ගත කර තිබුණු අතර, එය **2010** සිට **2014** දක්වා කාලය සඳහා රුපියල් මිලියන **62.5**කින් ද, **2014** සිට **2018** දක්වා කාලය සඳහා රුපියල් මිලියන **225.15**කින් ද, **2018** වර්ෂය සඳහා රුපියල් මිලියන **70.1**කින් ද සමන්විත වී තිබුණි. එමෙන්ම **2017** සහ **2018** වර්ෂවලට අදාළ රුපියල් මිලියන **1.91** ක දුම්රිය මාර්ග නඩත්තු ගාස්තු සමාලෝචිත වර්ෂයේ වියදමක් ලෙස ගිණුම්ගත කර ඇත. | ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව සහ ලංකා ඛණිජ තෙල් ගබඩා පර්යන්ත සමාගම අතර ගිවිසුමක් නොමැති වීම හේතුවෙන්, දුම්රිය මාර්ග නඩත්තු කිරීමේ පිරිවැය සඳහා ඉන්වොයිස් පත්‍ර ලංකා ඛණිජ තෙල් ගබඩා පර්යන්ත සමාගම වෙත ලැබී නොමැත. ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව, **2017** සහ **2018** වර්ෂයන්ට අදාළ ගාස්තු **2019** වසර තුළදී සමථයකට පත් කිරීමට දෙපාර්ශවයම එකඟ වූහ.<br>ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක **08** - ගිණුම්කරණ ප්‍රතිපත්ති, ගිණුම්කරණ ඇස්තමේන්තුවල වෙනස්වීම් සහ වැරදි යන ප්‍රමිතියෙහි **25** වන වගන්තිය අනුව, වර්තමාන කාල පරිච්ඡේදය | වර්ෂය තුළදී දරන ලද සියලුම වියදම් ගිණුම් ගත කිරීම සඳහා සුදුසු ක්‍රියා පිළිවෙත් අනුගමනය කළ යුතුය . |

| | | |
|---|---|---|
| | ආරම්භයේ දී සමුච්චිත බලපෑම තීරණය කිරීම සහ සියලු පෙර කාල පරිච්ඡේද සඳහා නව ගිණුම්කරණ ප්‍රතිපත්තියක් අනුගමනය කිරීම ප්‍රායෝගික නොවන විට, ප්‍රායෝගිකව අනුගමනය කල හැකි ආරම්භක දින සිටම අනාගතයේ සිට බලපැවැත්වෙන පරිදි නව ගිණුම්කරණ ප්‍රතිපත්තිය අනුගමනය කිරීම සඳහා ආයතනය සංසන්දනාත්මක තොරතුරු සකස් කළ යුතුය. | |
| (ඉ) 2018 සහ 2019 යන වර්ෂයන්හිදී මිලදී ගන්නා ලද මුළු එකතුව රුපියල් මිලියන 82.62ක අගයකින් යුත් අයිතම 11 ක් සමාගම විසින් ගිණුම්ගත කර නොතිබූ අතර සමාලෝචනයට භාජනය වූ වර්ෂය අවසානයේදී අත්තිකාරම් ගිණුමක් යටතේ හෝ තබා නොතිබුණි. | අයිතම 11 න් අයිතම 03 ක් ද්‍රව්‍ය වූ අතර 2020 දී එම ද්‍රව්‍ය නිෂ්කාශනය කරන ලදී. තවත් අයිතම 03 ක් 2020 වර්ෂයේදී ප්‍රාග්ධනීකරණය කර ඇත. අනෙකුත් අයිතම ණයවර ලිපි ගාස්තු(LC Charges) වලින් සියයට 90 ක ගෙවීම් සහ නොලද භාණ්ඩ ලැබීම සටහන් (GRN) වේ. | සියලුම වත්කම් අදාළ ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුව ප්‍රාග්ධනීකරණය කළ යුතුය. |
| (ඊ) වෙළඳ සහ ගෙවිය යුතු වෙනත් ශේෂයන් | | |
| (i) රජයේ සැපයුම්, ප්‍රසම්පාදන සැපයුම්, පොදු වවුචර් සැපයුම් සහ ප්‍රවාහන විකුණුම්කරුවන් සම්බන්ධ ණයහිමියන් 48කගේ රු. මිලියන 38.96 ක සමස්ථ හිඟ ශේෂයක් සමාලෝචනයට භාජනය වූ වසර අවසානයේදී පවතින බව නිරීක්ෂණය විය. 2010 වසරේ හෝ ඊට පෙර සිට පැවත එන රු. මිලියන 2.98 ක අගයකින් යුත් ණයහිමියන් 14 දෙනෙකුගෙන් ද, වසර 05 සිට වසර 10 දක්වා වන රුපියල් මිලියන 0.55 ක අගයකින් යුත් ණයහිමියන් 03 දෙනෙකුගෙන් ද, වසර 01 සිට 05 දක්වා වන රු. මිලියන 35.42 ක හර ශේෂ 31 කින් ද සමන්විත නොපියවූ ශේෂ පවතින බව නිරීක්ෂණය විය. පවත්නා හර ශේෂයන් පියවා නොගෙන එම ණයහිමියන් සමඟ සමාගම පසුව ගනුදෙනු කර ඇති බව නිරීක්ෂණය විය. එබැවින්, ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි නොමැති වීම හේතුවෙන් එම හර ශේෂයන්ගේ පැවැත්ම, නිරවද්‍යතාවය සහ තක්සේරු කිරීම විගණනයේදී සහතික නොවීය. | හර ශේෂයන් ගෙන් යුත් ණයහිමියන් බොහොමයක් නිෂ්කාශනය නොකර SAP (MIRO) පද්ධතිය සත්‍යාපනය කිරීමේදී වැරදියට සිදු කරන ලද ඉන්වොයිසි ආපසු හැරවීමකි. | සියලු එකඟ නොවූ ශේෂයන් කල්තියා විසඳීමට සුදුසු පියවර ගත යුතුය. |

| | | |
|---|---|---|
| **(ii) 2010** වසරේ හෝ ඊට පෙර සිට පාර්ශව **81** ක් සම්බන්ධයෙන් ගෙවිය යුතු රු. මිලියන **7.18** ක වෙළඳ ශේෂය, වසර **05** සිට **10** දක්වා කාලය තුළ රු.මිලියන **40.18** ක ගෙවිය යුතු ශේෂ **310** ක් සහ වසර **01** සිට වසර **05** දක්වා කාලය තුළ ගෙවිය යුතු රු.මිලියන **39.45** ක ශේෂ **18** ක් සමාලෝචනයට භාජනය වූ වර්ෂය අවසානයේදී ගෙවා නොතිබුණි. කෙසේ වෙතත්, ප්‍රමාණවත් හා සුදුසු විගණන සාක්ෂි නොමැති වීම හේතුවෙන් විගණනයට එම ශේෂයන්ගේ පැවැත්ම, නිරවද්‍යතාවය සහ තක්සේරුව සහතික කිරීමට නොහැකි විය. | ණයහිමියන් සම්බන්ධයෙන් දිගු කාලීනව වගකීම් ඇති අතර, ඒවා තවදුරටත් ගෙවීමට අවශ්‍ය නොවේ. ගෙවිය යුතු ඕනෑම ගිණුම් ශේෂයක් කපා හැරීමට පෙර සපුරාලිය යුතු නිර්ණායක ලැයිස්තුවක් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක **09 (SLFRS-09)** හෝ **IFRS 09** සපයා ඇත.<br>එම මාර්ගෝපදේශයන්ට අනුව, මූල්‍ය වගකීම් සමාගම විසින් හඳුනා නොගත යුත්තේ ගෙවීමේ වගකීම කල් ඉකුත් වූ විට, අවලංගු වූ විට හෝ නිදහස් කළ විට පමණි. එබැවින් ඒවා කාල රාමුව මත පදනම්ව කපා හරිනු නොලැබේ.<br>එබැවින්, එක් එක් ණයහිමියන්ගේ ගිණුම් විස්තරාත්මකව පරීක්ෂා කිරීමෙන් පසු එම ණයහිමියන්ගේ ශේෂයන් නැවත ලිවීමට අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය සමග විගණන හා කළමනාකරණ කමිටුවේ නිර්දේශය බලාපොරොත්තු වේ. | දිගුකාලීන ශේෂයන් ඉවත් කිරීම සඳහා සුදුසු පියවර ගත යුතුය. |
| (උ) සමාලෝචනයට භාජනය වූ වර්ෂය අවසානයේ පැවති රුපියල් මිලියන ක **8.8** වෙනත් ලැබිය යුතු ගිණුම් ශේෂයන් වසර **5** කට වැඩි කාලයක සිට අයකර ගෙන නොමැත. එබැවින්, ප්‍රමාණවත් හා සුදුසු විගණන සාක්ෂි නොමැතිවීම හේතුවෙන් විගණනයේදී මෙම ශේෂය නැවත අයකර ගැනීමේ හැකියාව පිලිබඳ සහතික කර නොමැත. | වැරදි ලෙස ගනු ලැබූ විවිධ ගනුදෙනුකරුවන්ගේ ශේෂයන්, ඉන්වොයිසිවල එකඟ නොවීම්, ගාස්තු හෝ හිඟ මුදල් එකතු කිරීම සඳහා තවදුරටත් ඉදිරියට යාම සඳහා සොයාගත හැකි ප්‍රමාණවත් සාක්ෂි නොමැති වීම් විවිධ ලැබිය යුතු ගිණුම් ශේෂ සඳහා හේතු වී ඇත.<br>මෙම ශේෂයන් බොහොමයක් පවතින්නේ **2010** වර්ෂයේ ක්‍රියාත්මක කරන ලද **SAP** ක්‍රමයට පෙර සිට වන අතර අවශ්‍ය නිර්දේශ ලබා ගැනීම සඳහා මෙය විගණන හා කළමනාකරණ කමිටුව වෙත යොමු කර ඇති අතර, විගණන හා කළමනාකරණ කමිටුව විසින් ශේෂයන් කපා හැරීමට නිර්දේශ කර ඇත්තේ මෙම ශේෂයන් දිගුකාලීනව පවතින බැවින් මෙම ශේෂයන් නැවත ලබා ගැනීමට නොහැකි වන නිසාත්ය. | දිගු කාලීන හිඟ මුදල් අය කර ගැනීමට සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය. |

| | | |
|---|---|---|
| (උ) සමාලෝචනයට භාජනය වූ වර්ෂය අවසානයේදී දේශීය ආදායම් දෙපාර්තමේන්තුව (IRD) විසින් පවත්වාගෙන යනු ලබන වාර්තාවල දැක්වෙන ශේෂයන් හා සමාගමේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ශේෂයන් අතර රුපියල් මිලියන 437.53ක වෙනසක් ගෙවිය යුතු ආදායම් බදු, ගෙවිය යුතු එකතු කළ අගය මත බදු (VAT), ගෙවිය යුතු රඳවා ගැනීම් මත බදු, ගෙවිය යුතු උපයන විට ගෙවීම් මත බදු (PAYE) සහ ගෙවිය යුතු ආර්ථික සේවා ගාස්තු (ESC) සම්බන්ධයෙන් දක්නට ලැබිණි. | දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ වාර්තා, ඔවුන්ගේ තක්සේරු කිරීම්වලට අනුව පවත්වා ගනු ලබන නමුත් සමාගමේ මූල්‍ය ප්‍රකාශනවල ස්වයං තක්සේරු ආදායම් බදු ගෙවීම් ලෙස ඊළඟ මාසයේදී ගෙවිය යුතු බදු වගකීම් ඇතුළත් වේ. දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් මතු කරන ලද එකඟ නොවූ තක්සේරු කිරීම්වලට එරෙහිව ඉදිරිපත් කර ඇති අභියාචනා අපගේ මූල්‍ය ප්‍රකාශනවල සඳහන් නොවේ. | දේශීය ආදායම් දෙපාර්තමේන්තුව සමග ඇති වෙනස්කම් නිවැරදි කිරීමට සුදුසු පියවර ගත යුතුය. |

**1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්**

**1.6.1 ලැබිය යුතු මුදල්**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) තීරුබදු සහ බදු නැවත අයකර ගැනීම<br>පසුගිය විගණන වාර්තාවේ සඳහන් පරිදි, 2017 වර්ෂයේදී ප්‍රතික්ෂේප වූ නැව් වෙනුවෙන් රේගු ගාස්තු හා බදු ලෙස රු. මිලියන 1,617.2 ක් සංස්ථාව විසින් ගෙවා තිබුණු අතර එහි වටිනාකම තුළ රු.මිලියන 648 ක නිෂ්පාදන බද්දක් ඇතුලත්ව තිබුණි.එකී ගෙවූ නිෂ්පාදන බද්ද නැවත අයකර ගැනීමට හෝ වෙනත් ගෙවීමකට අදාලව හිලව් කර ගැනීමට අදාළව ඵලදායී ක්‍රියාමාර්ග සංස්ථාව විසින් ගෙන නොතිබුණි. | මෙම ගෙවීම ආපසු අයකර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන ඇත. | මෙම මුදල නැවත අය කර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ආ) පසුගිය වර්ෂයේ විගණන වාර්තාවේ සඳහන් පරිදි, නැව් තෙල් මෙහෙයුම් කටයුතු සඳහා රේගු දෙපාර්තමේන්තුවට 2002 වසරේ සිට ගෙවිය යුතු ශේෂයක්ව පැවැති රු. මිලියන 57.7 ක් මහා භාණ්ඩාගාරයෙන් ප්‍රතිපූරණය කර ගැනීමේ පදනම යටතේ, සංස්ථාව විසින් ගෙවා තිබුණි. එහෙත් එම ගෙවීම ප්‍රතිපූරණය කර ගැනීමට අවශ්‍ය විධිමත් කටයුතු විගණන වාර්තාවේ දිනය දක්වා සිදු කර නොතිබුණි. | ශ්‍රී ලංකා රේගුවට ගෙවියයුතු වගකීම් පියවීම සඳහා මහා භාණ්ඩාගාරයේ උපදෙස් මත, ඛනිජ තෙල් නීතිගත සංස්ථාව විසින් 2014 වර්ෂයේදී රු. 57,736,913 ක් ශ්‍රී ලංකා රේගුවට ගෙවා ඇත.මේ සම්බන්ධයෙන් තවදුරටත් මැදිහත් වන ලෙස මහා භාණ්ඩාගාරයට ලිපියක් මගින් දන්වා ඇත. | මෙම මුදල පියවා ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග කඩිනමින් ගත යුතුය. |

**1.6.2 ගෙවිය යුතු මුදල්**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) විගණනයට ලද ශේෂ සනාථනයන්ට අනුව, 2007 සිට 2009 කාල සීමාව තුළ සිදු කරන ලද තෙල් මිලදී ගැනීම් වලට අදාලව සිදු කල ඉදිරි සුරැකුම් ගනුදෙනු හේතුවෙන් මහජන බැංකුවේ ගිණුම් වාර්තාවල රු. මිලියන 5,072.94ක වටිනාකමක් සංස්ථාව විසින් මහජන බැංකුවට ගෙවිය යුතු වටිනාකමක් ලෙස දක්වා තිබුණි. කෙසේ නමුත් සංස්ථාව විසින් එම වටිනාකම ගිණුම් ගත කිරීමට අවශ්‍ය කටයුතු සිදුකර නොතිබුණි. | ඉදිරි සුරැකුම් ගනුදෙනුවට අදාළ හිඟ මුදල් සම්බන්ධයෙන් මහජන බැංකුව විසින් ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට එරෙහිව කිසිදු නඩුවක් ගොනු කර නොමැත. | රජයේ ආයතනයක් ලෙස, මහජන බැංකුව සමග එකගතාවයකට පැමිණීමට කඩිනම් පියවර ගත යුතුය. |
| (ආ) සමාලෝචනයට භාජනය වූ වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවල, උපචිත වියදම් යටතේ " RF Dummy හා HO Dummy " යන ගිණුම් දෙකක මිලියන 103.82 ක් දීර්ඝ කාලය තිස්සේ නිරවුල් කිරීමෙන් තොරව පවතින බව නිරීක්ෂණය කරන ලදී. එබැවින්, මෙම ශේෂයන්ගේ නිරවද්‍යතාවය සහ පැවැත්ම විගණනයේදී දැඩි ලෙස සැක සහිත විය. | 2020 මුදල් වර්ෂයේ නිවැරදි ශේෂයන් පිළිබිඹු කිරීම සඳහා මෙම ශේෂයන් නිරවුල් කිරීමට යෝග්‍ය පියවර ගෙන ඇත. | මෙම වටිනාකම නිරවුල් කිරීමට කඩිනම් පියවර ගත යුතුය. |
| (ඇ) සේවකයන් 41 දෙනෙකුට අදාලව රුපියල් මිලියන 143.47ක ගෙවිය යුතු වටිනාකමක් "නැවත ගෙවිය යුතු තැන්පතු හා වෙනත්" යන ගිණුම යටතේ වසර ගණනාවක් පුරා නිරවුල් නොවී පැවති බව විගණනයට අනාවරණය විය. කෙසේ වෙතත්, වසර ගණනාවක් තිස්සේ මෙම ශේෂයන් නිරවුල් නොවී තිබීමට හේතු විගණනයට තහවුරු වී නොමැත. | 2020 වසරේදී මෙම ශේෂයන් නිරවුල් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන ඇති අතර අදාල ගිණුම්කරණ පිළිවෙත් සිදු කර ඇත. | මෙම වටිනාකම නිරවුල් කිරීමට කඩිනම් පියවර ගත යුතුය. |
| (ඈ) වෙළඳ හා වෙනත් ණයහිමියන් යටතේ වසර 5 ට වැඩි, එකතුව රුපියල් මිලියන 280.57ක් වූ හර ශේෂ 239ක් ද වසර 01 සිට වසර 05 දක්වා වන එකතුව රුපියල් මිලියන 3,443.44 ක් වූ හර ශේෂ 369 ක් ද සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් නිරවුල් නොවී පැවතුනි. පවත්නා හර ශේෂයන් පියවා නොගෙන හර ශේෂයන් ඇති මෙම ණයහිමියන් සමඟ සංස්ථාව ගනුදෙනු කර ඇති බව තවදුරටත් නිරීක්ෂණය විය. එබැවින් එම ශේෂයන්ගේ නිරවද්‍යතාවය සහ පැවැත්ම පිලිබඳව විගණනයට සැක සහිත විය. | හර ශේෂයන් 239 න් එකතුව රුපියල් මිලියන 36.8ක් වූ ණයහිමියන් 156ක් සමග පසුකාලීනව ගනුදෙනු සිදු කර නොමැත. | මෙම වටිනාකම නිරවුල් කිරීමට කඩිනම් පියවර ගත යුතුය. |
| (ඉ) විගණනයට ලබා දී ඇති වයස් විශ්ලේෂණයට අනුව, වෙළඳ හා වෙනත් ණයහිමියන්ට අදාළව එකතුව රුපියල් මිලියන 37,089.11 ක් වූ ණයහිමි | 2020 මුදල් වර්ෂයේ දී නිවැරදි ශේෂයන් පිළිබිඹු කිරීම සඳහා මෙම ශේෂයන් නිරවුල් කිරීමට යෝග්‍ය | මෙම ගෙවිය යුතු ශේෂයන් නිරවුල් කිරීමට සඳහා යෝග්‍ය |

| | | |
|---|---|---|
| ශේෂ **297** ක් සමාලෝචනයට භාජනය වූ වර්ෂය අවසානය වන විටත් වසර **05** කට වැඩි කාලයක් තිස්සේ නිරාකරණය නොවී පැවතුනි. කෙසේ වෙතත්, මෙම හිඟ වටිනාකම් පියවීම සඳහා සංස්ථාව විසින් කිසියම් යෝග්‍ය ක්‍රියාමාර්ගයක් ගෙන තිබේද යන්න සහතික කර ගැනීමට විගණනයට නොහැකි විය. එබැවින් මෙම ශේෂයන්ගේ නිරවද්‍යතාවය හා පැවැත්ම පිළිබඳව විගණනයට සැක සහිත විය. | පියවර ගෙන ඇත. | ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ඊ) **2013** වසරේදී මිලදී ගත් ඛනිජ තෙල් නිෂ්පාදන වෙනුවෙන් සංස්ථාව විසින් ටෙහෙරානයේ ජාතික ඉරාන සංස්ථාවට ඇමරිකානු ඩොලර් **250,925,169** ක් ගෙවිය යුතු අතර එය රු. මිලියන **32,343.52** කි. විගණනයට ඉදිරිපත් කරන ලද තොරතුරු වලට අනුව, එක්සත් ජනපදය විසින් ඉරානයට පනවා ඇති සම්බාධක හේතුවෙන් එවැනි හිඟ මුදල් ගෙවීම නතර කරන ලදී. එම ශේෂය එක් එක් වර්ෂයේ අවසාන විනිමය අනුපාතයට අනුව ගලපා ගෙවිය යුතු වටිනාකමක් ලෙස ආරම්භයේ සිටම පෙන්නුම් කරන අතර, ගැලපුමේ වෙනස සලකා බලන වර්ෂයේ හුවමාරු ලාභ හෝ අලාභ ගිණුමට මාරු කරයි. ඒ අනුව, සලකා බලන වර්ෂය අවසානයේදී ගෙවිය යුතු ශේෂය රු. මිලියන **45,811.68** ක් දක්වා වැඩි වී තිබුණි. පාලනය කළ නොහැකි බාහිර සාධක හේතුවෙන් මෙම ශේෂය සඳහා ගෙවීම සිදු කර නොමැති බව නිරීක්ෂණය විය. කෙසේ වෙතත්, මෙම වටිනාකම විකල්ප ක්‍රමවේදයක් මගින් නිරාකරණය කිරීමට සහ දීර්ඝ කාලයක් තිස්සේ එක්සත් ජනපද ඩොලරයට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියල ක්‍රමයෙන් අවප්‍රමාණය වෙමින් පවතින තත්වයක් තුළ මෙවැනි නිරාකරනය නොවූ ශේෂයක් දිගින් දිගටම තබා ගැනීමේ මූල්‍ය ශක්‍යතාව තක්සේරු කිරීමට කිසියම් උත්සාහයක් ගෙන තිබේද යන්න විගණනයට තහවුරු කර ගැනීමට නොහැකි විය. තවද, සම්බාධක හේතුවෙන් සිදුවන මූල්‍යමය බලපෑම මූල්‍ය ප්‍රකාශනවල පැහැදිලිව අනාවරණය කර නොමැත. | ජාතික ඉරාන තෙල් සංස්ථාවට ගෙවිය යුතු ඇ.ඩො. **250,925,169** ක ශේෂය ආරම්භ වූ අවස්ථාවේ සිටම, නීතිමය මාර්ග ඔස්සේ මෙම වටිනාකම පියවීමට ඛනිජ තෙල් නීතිගත සංස්ථාව විසින් සෑම උත්සාහයක්ම ගෙන තිබේ. එමෙන්ම, මෑත කාලීනව මෙම ගෙවීම සිදු කරන ආකාරය පිළිබඳව ඛනිජ තෙල් නීතිගත සංස්ථාව විසින් මහ බැංකුව, විදේශ කටයුතු අමාත්‍යාංශය ඇතුළු ආයතන කිහිපයකින් විමසීම් කර ඇත. ඉරාන රජය විසින් අද දක්වා මෙම ගෙවීම පිළිබඳව සැලකිලිමත් වන බැවින් මෙම වටිනාකම ගෙවිය යුතු වටිනාකමක් ලෙස තබා ගෙන ඇත. මෙම වටිනාකම නිරාකරණය කිරීම සඳහා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය සමඟ එක්ව යාන්ත්‍රණයක් දැන් ස්ථාපිත කර තිබේ. | මේ සම්බන්ධයෙන් අදාළ පිරිවැය සහ වෙනත් ප්‍රතිවිපාක අවම කිරීම සඳහා සංස්ථාව විසින් සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (උ) **2010** සිට සංස්ථාවේ ගිණුම්වල දැක්වෙන මතභේදයට තුඩු දුන් භාණ්ඩ සඳහා වන ප්‍රතිපාදන ලෙස වෙන් කර ඇති රු. **2,500,000**ක වටිනාකම පිළිබඳව විගණනයට සැක සහිත වේ. | මෙම වටිනාකමට අදාලව අදහස් දැක්වීමක් ලබා දී නොමැත. | නිරවුල් නොවූ සියලු ශේෂයන් කල්තියා නිරවුල් කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |

**1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) යහපාලනය සඳහා රාජ්‍ය ව්‍යාපාර මාර්ගෝපදේශ පිළිබඳ 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරණ රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය. | | | |
| (i) මාර්ගෝපදේශ අංක 4.3 | අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වාර්තා රේඛීය අමාත්‍යාංශයේ ලේකම්වරයාහට එම වාර්තා සහතික කිරීමෙන් පසු දින 10 ක් ඇතුලත යැවිය යුතු වුවත් ඊට අනුකූලව කටයුතු කර නොතිබුණි. | සංස්ථාවේ සාමාන්‍ය ක්‍රියාපටිපාටිය තුළ මෙය සිදු නොකළ අතර ඉදිරියේදී වාර්තා යවනු ලැබේ. | අදාළ මාර්ගෝපදේශයට අනුකූල විය යුතුය. |
| (ii) මාර්ගෝපදේශ අංක 5.2.2 | ඇස්තමේන්තුගත පිරිවැය එකතුව රු. මිලියන 34,094.5 ක් වූ ප්‍රාග්ධන ව්‍යාපෘති 106 ක් නිසි ශක්‍යතා අධ්‍යයනයකින් තොරව සිදු කර ඇත. | 2019 වර්ෂයේදී නව ප්‍රාග්ධන අයිතම සඳහා ශක්‍යතා අධ්‍යයන අයවැයට ඇතුළත් කර ඇත. | එය අදාළ මාර්ගෝපදේශයට අනුකූල විය යුතුය. |
| (iii) මාර්ගෝපදේශ අංක 5.2.4 හා 5.2.5 | අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද අවසන් යාවත්කාලීන කරන ලද අයවැයේ පිටපත් 2019 වර්ෂයේ ආරම්භයට දින 15 කට පෙර රේඛීය අමාත්‍යාංශය, රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුව, මහා භාණ්ඩාගාරය සහ විගණකාධිපති වෙත යොමු කර නොමැත. | 2019 වර්ෂය සඳහා වාර්ෂික අයවැය 2018.09.10 දින අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කර ඇත. එබැවින් මාර්ගෝපදේශ සපුරා ඇත. අනුමත අයවැය නියමිත දිනට හෝ ඊට පෙර අමාත්‍යාංශයට රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුවට සහ විගණකාධිපතිතුමට ඉදිරිපත් කිරීමට සටහන් කර ගතිමි. ඒ අනුව 2020 වර්ෂය සඳහා අයවැය 2019.12.03 දින ඉදිරිපත් කර ඇත. | එය අදාළ මාර්ගෝපදේශයට අනුකූල විය යුතුය. |

| | | | |
|---|---|---|---|
| **(iv)** මාර්ගෝපදේශ අංක **7.2** | සංස්ථාවේ ලිහිසි තෙල් ව්‍යාපාරය, තාර ව්‍යාපාරය, නැව්තෙල් ව්‍යාපාරය , සහ කෘෂි ව්‍යාපාර සඳහා වන සියලුම ප්‍රධාන ක්‍රියාකාරකම් ඇතුළුව ක්‍රියා පටිපාටි අත්පොත සංස්ථාව විසින් සකස් කර නොතිබුණි. | තාක්ෂණික සේවා සහ ආයතනික කටයුතු අංශය මඟින් සම්මත මෙහෙයුම් ක්‍රියා පටිපාටි **(SOP)** සංවර්ධනය කෙරේ. | අදාළ මාර්ගෝපදේශය ට අනුකූල විය යුතුය |
| **(v)** මාර්ගෝපදේශ අංක **9.3** | රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව හා මහා භාණ්ඩාගාරයේ එකඟතාවය මත අමාත්‍යාංශය විසින් අනුමත කරන ලද බඳවා ගැනීමේ හා උසස්වීම් ක්‍රියාපටිපාටියක් සංස්ථාවට නොතිබුණි. | මේ පිළිබඳ සමාලෝචනයන් සිදු කරමින් පවතී. | අදාළ මාර්ගෝපදේශය ට අනුකූල විය යුතුය |
| (ආ) **1997** ඔක්තෝබර් **24** දිනැති අංක **124** දරණ මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශ චක්‍රලේඛය | පුරප්පාඩු වූ තනතුරක රාජකාරි ආවරණය කිරීම මාස **03** ක කාල සීමාවකට සීමා කළ යුතුය. එසේ වුවද, මාස **8** කට වැඩි කාලයක් පුරාවට පුරප්පාඩු වූ තනතුරු **03** ක, වැඩ ආවරණය කිරීම සඳහා නිලධාරීන් **05** දෙනෙකු අනුයුක්ත කර තිබුණි. | තනතුරු **22** ක් සඳහා අභ්‍යන්තර දැන්වීම් නිකුත් කර ඇති අතර අනෙක් තනතුරු **11** සඳහා ඉදිරියේදී දැන්වීම් නිකුත් කරනු ලැබේ. | අදාළ චක්‍රලේඛයට අනුකූල විය යුතුය |
| (ඇ) **2016** අප්‍රේල් **29** දිනැති අංක පීඊඩී **03/2016** සහ **2013** නොවැම්බර් **04** දිනැති අංක එෆ්පී**/06/35/02/01** දරණ රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය. | සමාලෝචිත වර්ෂය සඳහා සේවකයින්ගේ වැටුප් වෙනුවෙන් සංස්ථාව විසින් රු .මිලියන **173.7**ක උපයන විට ගෙවීම් බදු ඔවුන්ගේ වැටුපෙන් අඩු නොකොට එහි වියදමක් වශයෙන් දරා තිබුණි. | සේවකයාගේ වැටුපට අමතර ප්‍රතිලාභයක් ලෙස එකතු කරන ලද උපයන විට ගෙවීම් මුදල **2017** අංක **24.** දරණ දේශීය ආදායම් පනත අනුව අඩු කරනු ලැබේ. | අදාළ චක්‍රලේඛයට අනුකූල විය යුතුය |
| (ඈ) රාජ්‍ය ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය **(2006) -** මාර්ගෝපදේශ අංක **4.2** | ඉදිරි වසර **03** සඳහා වූ ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මක් සංස්ථාව විසින් පිළියෙල කර නොතිබුණි. | **2019** දී රජයේ විගණන අංශය විසින් සිදු කරන ලද පරීක්ෂණයෙන් පසු, **2020** වසරේ සිට වසර තුනක ඉල්ලුම පුරෝකථනය කරමින් ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මක් ඛනිජතෙල් නීතිගත සංස්ථාව විසින් සකස් කර ඇත. | එය අදාළ මාර්ගෝපදේශය ට අනුකූල විය යුතුය. |
| (ඉ) මුල්‍ය රෙගුලාසි**396** | නිකුත් කරන දිනයේ සිට මාස හයක් ගතවූ චෙක්පත් වලංගු චෙක්පතක් ලෙස නොසලකා මුල් ගනුදෙනුව ආපසු ගැලපිය යුතුය. කෙසේ වෙතත්, නිකුත් කළ නමුත් ඉදිරිපත් නොකළ චෙක්පත් රුපියල් **2, 776,064** අවලංගු කර ආපසු | නෛතික තත්ත්වයන් සලකා බලා එම වගකීම් පියවා ඇති බව සනාථ කිරීම සඳහා ගනුදෙනුව ආපසු හැරවීමකින් තොරව ඛනිජ තෙල් නීතිගත සංස්ථාව සමහර | එය අදාළ රෙගුලාසි වලට අනුකූල විය යුතුය. |

| | |
|---|---|
| ගැලපීමකින් තොරව ඉදිරියට ගෙන ගොස් තිබුණි. | චෙක්පත් තබා ගනී. සේවකයින්ට නිකුත් කරන ලද සමහර චෙක්පත් ආපසු හැරවීමකින් තොරව තබා ඇති අතර ඔවුන් පැමිණ චෙක්පතේ වලංගු භාවය දීර්ඝ කිරීමේ සම්භාවිතාවක් ඇත. අනෙකුත් චෙක්පත් පසුව ආපසු හරවන ලදී. |

**2.** මූල්‍ය සමාලෝචනය

--------------------

**2.1** මූල්‍ය ප්‍රතිඵල

-------------

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. මිලියන **11,856.6** ක අලාභයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ අලාභය රු. මිලියන **106,140.404** කි. එබැවින් මූල්‍ය ප්‍රතිඵලයේ රුපියල් මිලියන **94,283.804** ක වර්ධනයක් නිරීක්ෂණය විය. එම වර්ධනයට ප්‍රධාන හේතුව වූයේ විනිමය අනුපාත විචල්‍යතා වියදම සියයට **110** කින් අඩු වීම වේ.

**2.2** අනුපාත විශ්ලේෂණය

---------------------

ඉදිරිපත් කරන ලද තොරතුරු වලට අනුව, සමාලෝචනය කරන ලද වර්ෂය සහ ඊට පෙර වර්ෂය සඳහා සංස්ථාවේ සහ සමූහයේ වැදගත් ගිණුම්කරණ අනුපාත කිහිපයක් පහත දැක්වේ.

| | සංස්ථාව | | සමූහය | |
|---|---|---|---|---|
| <u>අනුපාත</u> | **2019** | **2018** | **2019** | **2018** |
| <u>ලාභදායී අනුපාත</u> | | | | |
| දළ ලාභ/ (අලාභ) අනුපාතය (GP) (%) | 0.68 | (0.72) | (0.59) | (1.77) |
| මෙහෙයුම් ලාභ/ (අලාභ) අනුපාතය (%) | (3.02) | (4.21) | (2.65) | (4.04) |
| ශුද්ධ ලාභ/ (අලාභ) අනුපාතය (NP) (%) | (1.88) | (18.45) | (1.63) | (18.45) |
| ද්‍රවශීලතා අනුපාත | | | | |
| ජංගම වත්කම් අනුපාතය (වාර ගණන) | 0.47 | 0.44 | 0.48 | 0.45 |
| ක්ෂණික වත්කම් අනුපාතය (වාර ගණන) | 0.36 | 0.34 | 0.38 | 0.35 |
| ආයෝජන අනුපාත | | | | |
| වත්කම් මත ප්‍රතිලාභ (ROCE) (%) | -1 | 33.81 | -2.11 | 36.46 |

පසුගිය වසරට සාපේක්ෂව සමාලෝචනයට භාජනය වූ වර්ෂය තුළ සංස්ථාවේ දළ ලාභ / (අලාභ) අනුපාතය සහ මෙහෙයුම් ලාභ / (අලාභ) අනුපාතය පිළිවෙලින් සියයට **1.18** සහ සියයට **1.39** කින් ඉහළ ගොස් තිබුණි.

**3.** **මෙහෙයුම් සමාලෝචනය**

**3.1** **කළමනාකරණ අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) දීර්ඝ කාලයක් තිස්සේ ගිවිසුමකට එළඹීමකින් තොරව සංස්ථාව විසින් පුද්ගලික සමාගමකට අඛණ්ඩව ද්‍රව ගෑස් වායුව සපයා තිබුණි. | ලිට්රෝ ගෑස් ලංකා සමාගම - දැනටමත් ගිවිසුමකට එළඹ ඇත. ලාෆ්ස් ගෑස් ලිමිටඩ් - ගිවිසුම කෙටුම්පත් කර ඇති අතර මෙම මාසය තුළ අවසන් කර අත්සන් කරනු ඇත. | ඛනිජ තෙල් නීතිගත සංස්ථාව ප්‍රමාදයකින් තොරව ගිවිසුම්වලට එළඹිය යුතුය. |
| (ආ) ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්තය විසින් හඳුන්වා දී ඇති ව්‍යවසාය සම්පත් සැලසුම් (ERP) පද්ධතිය සම්බන්ධයෙන් එකිනෙකාගේ වගකීම් හා භාවිතය පැහැදිලි කරමින් ඛනිජ තෙල් නීතිගත සංස්ථාව, ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්තය (CPSTL) සහ ලංකා ඉන්දියානු තෙල් සමාගම (LIOC) අතර කිසිදු ගිවිසුමක් නොමැති බව නිරීක්ෂණය විය. විශේෂයෙන් ඉන්ධන තොග සමාලෝචන අරමුණු සහ පිරිපහදු ක්‍රියාකාරිත්වය සඳහා මෙම පද්ධතිය ප්‍රමාණවත් ලෙස භාවිතා නොකෙරෙන බව නිරීක්ෂණය විය. | ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගම විසින් මොහොමඩ් අලි සබ්රි මහතාගේ උපදෙස් මත සකස් කරන ලද ත්‍රි-පක්ෂ ගිවිසුම 2010 අප්‍රේල් 01 වන දින ERP පද්ධතිය ක්‍රියාත්මක කිරීමට පෙර පාර්ශව තුනක් විසින් අත්සන් කිරීමට නියමිතව තිබුණු නමුත් මේ දක්වා අත්සන් කර නොමැත. 2016 වර්ෂයේදී මෙම ආයතන තුනෙහි නීති නිලධාරීන්, තොරතුරු තාක්ෂණ නිලධාරීන්, අමාත්‍යාංශයෙහි නීති නිලධාරි, අමාත්‍යවරයාගේ නීති උපදේශක ලෙස නඳුන් පෙරේරා මහතාගේ සහභාගීත්වයෙන් ගිවිසුම නැවත කෙටුම්පත් කරන ලද අතර CPSTL හි අධ්‍යක්ෂ ලලිත් ලියනගේ මහතා කමිටුවේ මූලසුන දැරීය. අවසාන වශයෙන්, එය අමාත්‍යාංශය හරහා නීතිපතිගේ අනුමැතියට යවා ඇති බව අපට දන්වන ලදී. ඉන්පසු කිසිවක් සිදු නොවීය. 2019 අප්‍රේල් මාසයේ දී, ද්වි පාර්ශවීය ගිවිසුමක් අත්සන් කරන ලෙස ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලය නියෝගයක් ලබා දී ඇත. ඒ අනුව කෙටුම්පත් ගිවිසුම සකස් කර CPSTL වෙත යවන ලදි. (ඛනිජ තෙල් නීතිගත | ඛනිජ තෙල් නීතිගත සංස්ථාව සියලු අදාළ පාර්ශවයන්ගේ එකඟතාවයකින් යුතුව ගිවිසුම්වලට එළඹිය යුතුය. |

| | | |
|---|---|---|
| | සංස්ථාවේ කණ්ඩායම් සාමාජිකයින් විසින් LIOC ආයතනයෙන් පද්ධති වෙනස් කිරීම් / නව වැඩිදියුණු කිරීම් / යනාදිය සඳහා අනුමැතිය ලබා ගත යුතු බවට ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගමේ තොරතුරු තාක්ෂණ අංශය අපේක්ෂා කරයි) | |
| (ඇ)පොදු පරිශීලක පහසුකම් සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය. | | |
| (i) ශ්‍රී ලංකා රජය (GOSL), ඛනිජ තෙල් නීතිගත සංස්ථාව සහ ලංකා ඉන්දියන් තෙල් සමාගම අතර ඇති කර ගත් 2003 දෙසැම්බර් 30 දිනැති පොදු පරිශීලක පහසුකම් කොටස් හිමියන්ගේ ගිවිසුම(GOSL / CPC / LIOC), එම ගිවිසුමේ 15 වන වගන්තිය ප්‍රකාරව 2008 දෙසැම්බර් 31 දිනෙන් කල් ඉකුත් වී තිබුණි. එබැවින්, ආයතනවල පාලන ක්‍රියා පටිපාටි, පර්යන්ත ගාස්තු ඇතුළු ප්‍රවාහන ගාස්තු සහ ප්‍රවාහන වියදම් තීරණය කිරීම සඳහා භාවිතා කරන මිල සූත්‍රය (2011 දී අවසන් වරට සංශෝධනය කරන ලද) ඇතුළු එවැනි ගිවිසුම් යටතේ ආවරණය වන පොදු පරිශීලක පහසුකම් සියලු දෙනාගේ එකඟතාවයෙන් සංශෝධනය කර නොතිබුණි. | විගණන වාර්තාවේ සඳහන් පරිදි, ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්තය හා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව අතර කිසිදු ගිවිසුමක් අත්සන් කර නොමැත. එබැවින් 2008 දෙසැම්බර් 31 දිනෙන් කල් ඉකුත්වීමට ගිවිසුමක් නොතිබුණි. | ඛනිජ තෙල් නීතිගත සංස්ථාව සියලු අදාළ පාර්ශවයන්ගේ එකඟතාවයකින් යුතුව ගිවිසුමකට එළඹිය යුතුය. |
| (ii) සංස්ථාව විසින් 2019 මැයි මස 13 වන දින ලංකා ඉන්දියන් තෙල් සමාගම(LIOC) නොමැතිව ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගම (CPSTL) සමඟ පමණක් ගිවිසුමකට එළඹ තිබුණි. මෙම ගිවිසුමට අනුව ඛනිජ තෙල් නිෂ්පාදන ගබඩා කිරීම හා ප්‍රවාහනය කිරීම පිළිබඳ නියමයන් සහ කොන්දේසි සහ මෙහෙයුම් ගාස්තු තීරණය කරන ආකාරය පිළිබද එකඟ වී තිබුණි. කෙසේ වෙතත්, 2003 දෙසැම්බර් 30 දිනැති පොදු පරිශීලක පහසුකම් කොටස් හිමියන්ගේ ගිවිසුමට (GOSL / CPC / LIOC) සිටි ප්‍රධාන පරිශීලකයෙකු සහ පාර්ශවකරුවෙකු වන LIOC වෙත බලපාන එම විෂයයට අදාළ නියමයන් | (ii) සංස්ථාව, ඛනිජ තෙල් තොග පර්යන්ත සමඟ පොදු පරිශීලක පහසුකම් ගිවිසුමක් අත්සන් කර නොමැත. මෙම ආයතන දෙක අතර කිසිදු එකඟතාවයක් නොතිබු හෙයින් දෙපාර්ශ්වය අතර ප්‍රායෝගික ගැටලු විසඳීම සඳහා දෙපාර්ශ්වයම 2019 දී ගිවිසුමක් අත්සන් කළහ. | ඛනිජ තෙල් නීතිගත සංස්ථාව සියලු අදාළ පාර්ශවයන්ගේ එකඟතාවයකින් යුතුව ගිවිසුමකට එළඹිය යුතුය. |

| | | |
|---|---|---|
| සහ කොන්දේසි නිර්වචනය කර නොතිබුණි. එබැවින්, සංස්ථාව සහ ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගම (CPSTL) අතර ඇති කර ඇති නියමයන් සහ කොන්දේසි ලංකා ඉන්දියන් තෙල් සමාගම විසින් ප්‍රතික්ෂේප කරනු ලැබුවහොත්, ඇතිවිය හැකි අහිතකර තත්වයන් සහ පිරිවැය සංස්ථාව විසින් දැරිය යුතු බව නිරීක්ෂණය විය. | | |
| (iii) 2019 මැයි 03 දිනැති අංක 43/1227 දරණ අධ්‍යක්ෂ මණ්ඩල තීරණයට අනුව, 2019 අප්‍රේල් 01 දින සිට බලපැවැත්වෙන පරිදි මෙහෙයුම් ගාස්තු වැඩිකිරීමට අනුමැතිය ලබා දී ඇත. මෙම සංශෝධනය ක්‍රියාත්මක කිරීමේ දිනය පෙරදාතම කිරීමේ ප්‍රතිපලයක් ලෙස 2019 අප්‍රේල් මාසය සඳහා රුපියල් මිලියන 173.77 ක අමතර ගෙවීමක් කිරීමට සිදු වී තිබුණි. | (iii)1. 2019.03.26 දින පැවති ජ්‍යෙෂ්ඨ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී මෙහෙයුම් ගාස්තු වැඩි කිරීම සඳහා තීරණය කර ඇත.<br><br>2. 2019 අප්‍රේල් 01 වන දින සිට බලපැවැත්වෙන පරිදි අලෙවිකරණ සමාගම් දෙකකින් අය කරනු ලබන පර්යන්ත ගාස්තු සංශෝධනය කිරීම සඳහා චක්‍රලේඛ මණ්ඩල පත්‍රිකාව අනුමත කර ඇති බව 2019 මාර්තු 29 දිනැති ලිපියෙන් ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගමේ සභාපති විසින් දන්වා තිබුණි.<br><br>3. 2019 අප්‍රේල් 04 වන දින පැවති තීරුබදු කමිටු රැස්වීමේදීද මේ පිළිබඳව සාකච්ඡා කෙරිණි.<br><br>4. ඉහත කරුණු වලට අනුව, 2016.04.01 දින සිට බලපැවැත්වෙන පරිදි පර්යන්ත ගාස්තු 27% කින් වැඩි කිරීමට ඛනිජ තෙල් නීතිගත සංස්ථාව අනුමත කර ඇත. | ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට පිරිවැය අවම වන පරිදි කළමනාකාරිත්වය විසින් සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (iv) 2003 දෙසැම්බර් 30 දිනැති පොදු පරිශීලක කොටස්කරුවන්ගේ ගිවිසුම ප්‍රකාර (සංස්ථාව,ඉන්දියානු තෙල් සමාගම සහ ශ්‍රී ලංකා රජය අතර ) සහ 2019 මැයි 13 දිනැති සංස්ථාව සහ තොග ගබඩා පර්යන්ත සමාගම සමග එළඹි ගිවිසුම අනුව, නල මාර්ගයේ හෝ එහි කොටසක් පිළිගත් ප්‍රමිතීන්ට අනුව පවත්වාගෙන යාම සහ මාස දෙකකට අවශ්‍ය ඉන්ධන තොග පවත්වාගෙන | (iv) නල මාර්ග නිසි ලෙස නඩත්තු නොකිරීම, පිළිගත් ප්‍රමිතීන්ට අනුකූල SPBM දෙකක් පැවතීම, අවම වශයෙන් මාස දෙකකවත් රටේ ඉල්ලුම සපුරාලීම සඳහා ප්‍රමාණවත් ගබඩා පහසුකම් නොතිබීම හේතුවෙන් ඛනිජ තෙල් නීතිගත සංස්ථාව විසින් 2014 සිට මේ දක්වා ඇමරිකානු ඩොලර් | සංස්ථාවට පිරිවැය අවම කර ගැනීම සඳහා කළමනාකාරිත්වය විසින් සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය. |

| | | |
|---|---|---|
| යාමට ගබඩා පහසුකම් සැපයීම, තොග ගබඩා පර්යන්ත සමාගමේ වගකීමකි. කෙසේවෙතත්, නල මාර්ගයේ අවහිරතා සහ ගබඩා කරන පද්ධතියේ අකාර්යක්ෂමතා හේතුවෙන් නෞකාවකින් තෙල් ගොඩබෑමේදී සිදුවන ප්‍රමාදයන් වෙත ප්‍රමාද ගාස්තු ගෙවීමට සංස්ථාවට සිදුවේ. ඒ අනුව, පසුගිය වසර **05** සඳහා ප්‍රමාද ගාස්තු ලෙස ඇ.ඩො. **2,606,556** ක මුදලක් ප්‍රමාද ගාස්තු ලෙස ගෙවා ඇති අතර, ඇ.ඩො. **12,644,257**ක් ගෙවීමට නියමිතව ඇත. කෙසේවුවද, එම පිරිවැය සේවා සැපයුම්කරු වෙත මාරු කර නොමැත. | **2,606,555.72** ක ප්‍රමාද ගාස්තු ගෙවා ඇති අතර ගෙවිය යුතු තවත් (දළ වශයෙන් ඇ.ඩො. **12,644,257.29**ක) ප්‍රමාද ගාස්තු මුදලක් පවතී. | |
| (v) ගිවිසුම් ප්‍රකාරව , මෙහෙයුම් ගාස්තු ගබඩා පර්යන්ත පිරිවැය සහ ලාභ ආන්තිකයෙන් සමන්විත වේ. ගබඩා පර්යන්ත පිරිවැයට පුද්ගල පිරිවැය, පොදු කාර්ය සහ නඩත්තු පිරිවැය සහ තොග ගබඩා පර්යන්ත සමාගමේ වත්කම් ක්ෂයවීම් ඇතුළත් වේ. ඉන් අදහස් වන්නේ තොග ගබඩා පර්යන්ත සමාගම වෙත ගෙවන ලද ප්‍රවාහන ගාස්තු එකඟ වූ මෙහෙයුම් ගාස්තු වලින් වෙනස් බවය. කෙසේවෙතත්,මෙහෙයුම් ගාස්තු සඳහා ගබඩා පර්යන්ත පිරිවැය තීරණය කිරීමේදී තොග ගබඩා පර්යන්ත සමාගමේහි ප්‍රවාහන සම්බන්ධ පිරිවැය බැහැර කර ඇත්දැයි තහවුරු කර ගැනීමට විගණනයට අපොහොසත් විය. එහි ප්‍රතිපලයක් ලෙස තොග ගබඩා පර්යන්ත සමාගම වෙත ප්‍රවාහන ගාස්තු ප්‍රතිපූරණය කිරීම ද්විගුනන විය හැකිය. සංස්ථාවේ වාර්තාවලට අනුව, සමාලෝචනයට භාජනය වූ වර්ෂය තුළ රු.මිලියන **2,247.2** ක් තොග ගබඩා පර්යන්ත සමාගම වෙත ප්‍රවාහන ගාස්තු වශයෙන් ගෙවා ඇත. | ඛනිජ තෙල් තොග ගබඩා සමගම සතු බවුසර් අංගනයේ මුළු පිරිවැය ඛනිජ තෙල් තොග ගබඩා සමාගම වෙතින් ඉල්ලා ඇති අතර මෙම ද්විගෙවීම වැලැක්වීම සඳහා ප්‍රතිදාන ගාස්තු වලින් **5%** ක් **2020** අප්‍රේල් සිට මේ දක්වා අත්හිටුවා ඇත. | සංස්ථාවට පිරිවැය අවම කිරීම සඳහා කළමනාකාරිත්වය විසින් සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (vi)**2003** දෙසැම්බර් **30** දිනැති පොදු පරිශීලක පහසුකම් සම්බන්ධ කොටස් හිමියන්ගේ ගිවිසුමේ අර්ථ දැක්වීම් අනුව (ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව, ලංකා ඉන්දියන් තෙල් සමාගම සහ ශ්‍රී ලංකා රජය අතර), ගබඩා පර්යන්ත පිරිවැය ලෙස,*"(ඇ) වාර්ෂිකව සියයට දොළහක (12%) පොලී අනුපාතයක් යටතේ සමාගමට ලබා දී ඇති* | සටහන් කරගෙන ඇති අතර පිළියමක් ලෙස පහත සඳහන් ක්‍රියාමාර්ග ගෙන ඇත.<br>1. **2016** ජුනි මාසයේ සිට **2017** දෙසැම්බර් දක්වා සඳහා ගෙවීම්වලින් රුපියල් මිලියන **1.173** ක පොලී ගාස්තුවක් රඳවා ගෙන ඇත. | ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට පිරිවැය අවම කිරීම සඳහා කළමනාකාරිත්වය විසින් සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය. |

| | | |
|---|---|---|
| *ණය සඳහා පොලිය සහ ගබඩා වත්කම් හා වගකීම්වලින් කොටසක් මෙන්ම මුදල් හිඟය පියවා ගැනීම සඳහා ගනු ලබන ණය සඳහා පොලිය"* ලෙස අර්ථ දැක්විය හැකිය. මෙම ගිවිසුම 2008 දෙසැම්බර් 31 දිනෙන් කල් ඉකුත් විය. කෙසේ වෙතත්, ගිවිසුම කල් ඉකුත්වීමෙන් පසුව ද ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගම විසින් මහජන බැංකුවෙන් 2009 දී ලබාගත් ණයවලට අදාළව 2009 සිට 2016 දක්වා කාලය සඳහා වූ රුපියල් මිලියන 2,183 ක් ඉක්මවූ පොළී ප්‍රමාණයක් ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව ගෙවා ඇත. නිසි ඇගයීමකින් සහ ගිවිසුමට අනුව ගෙවිය යුතු සැබෑ මුදල සනාථ කිරීමකින් තොරව ගෙවීම් කර ඇති බව නිරීක්ෂණය විය. | 2. මෙහෙයුම් ගාස්තුවේ පොලී සංරචකය 2018.01.01 දිනෙන් ඉවත් කර ගැනීමට තීරණය කර ඇත. | |
| (vii) පිළිගත් ප්‍රමිතීන්ට අනුව, නල මාර්ග නඩත්තු කිරීම සහ ප්‍රමාණවත් ගබඩා පහසුකම් සැපයීම අනුබද්ධ සමාගමක් වන ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමගමෙහි (CPSTL) ප්‍රධාන කාර්යභාරය වේ. ඒ අනුව, රටේ ඉන්ධන සැපයුම සඳහා ගබඩා කිරීම හා පර්යන්ත පහසුකම් සම්බන්ධ යටිතල පහසුකම් සංවර්ධනය කිරීම වෙනුවෙන් මෙහෙයුම් වියදම් ලෙස සැලකිය යුතු මුදලක් ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගම වෙත මාරු කර ඇත. සමාලෝචනයට භාජනය වූ වර්ෂය තුළ ක්ෂයවීම් ලෙස රුපියල් මිලියන 1,029.1ක් කපා හැර තිබූ අතර එය පසුගිය වසර 10 සඳහා රු. මිලියන 10,085.52කි. මීට අමතරව සමාලෝචනයට භාජනය වූ වර්ෂය තුළ ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගම විසින් ලාභ ආන්තිකයක් ලෙස රු.මිලියන 3,400.97 ක් අය කර ඇති අතර පසුගිය වසර 10 තුළ අය කරන ලද මුළු මුදල රු. මිලියන 40,802.66 කි. කෙසේ වෙතත්, නව යටිතල පහසුකම් සංවර්ධනය කිරීමට සහ පවත්නා පහසුකම් කඩිනමින් නඩත්තු කිරීමට ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගම විසින් කිසිදු ඵලදායී පියවරක් ගෙන ඇති බව සහතික කිරීමට විගණනයට නොහැකි විය. | අදහස් දක්වා නොමැත | ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට පිරිවැය අවම කිරීම සඳහා කළමනාකාරිත්වය විසින් සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය. |

| | | |
|---|---|---|
| (ඉ) ඉකුත් වර්ෂයේ වාර්තාවල සඳහන් පරිදි, ලංකා විදුලි බල මණ්ඩලය ඇතුළු ප්‍රධාන ගනුදෙනුකරුවන් 13 දෙනෙකු සමඟ ඉන්ධන සැපයුම සඳහා විධිමත් ගිවිසුම් අත්සන් කර නොතිබුණි. සමාලෝචනයට භාජනය වූ වර්ෂය අවසානයේදී එම ගනුදෙනුකරුවන්ගෙන් ලැබිය යුතු ශේෂය රු. මිලියන 91,722කි. | කෙටුම්පත් කරන ලද ගිවිසුම් අදාළ පාර්ශවයන් වෙත යොමු කිරීමට ඛනිජ තෙල් නීතිගත සංස්ථාව කටයුතු කර ඇති අතර එම කටයුතු අවසන්වීමෙන් පසුව ගිවිසුම් අත්සන් කිරීමට කටයුතු සිදු කරමින් පවතී. | ප්‍රධාන ගනුදෙනුකරුවන් සමඟ නිසි ගිවිසුම් ඇති කර ගැනීමට සංස්ථාව අවශ්‍ය පියවර ගත යුතුය. |
| (ඊ) හෙජිං ගනුදෙනු<br>2007 සිට 2009 දක්වා කාලය තුළ තෙල් ප්‍රසම්පාදනය සඳහා සිදු කරන ලද හෙජිං ගනුදෙනු සම්බන්ධයෙන් සිදු කරන ලද විගණන පරීක්ෂණයට අනුව, 2019 දෙසැම්බර් 31 දින වන විට එම ගනුදෙනු හේතුවෙන් රටට සිදුවී ඇති මුළු අලාභය රු. මිලියන 14,028 කි. එමෙන්ම, කොමර්ෂල් බැංකුව විසින් ඇමරිකානු ඩොලර් 8,648,300 ක් ඉල්ලා සංස්ථාවට එරෙහිව කොළඹ වාණිජ මහාධිකරණයේ නඩුවක් ගොනු කර තිබුණි. ඊට අමතරව, හෙජිං ගනුදෙනු සම්බන්ධයෙන් සංස්ථාවෙන් ලැබිය යුතු යැයි මහජන බැංකුවේ මූල්‍ය ප්‍රකාශනවල ඇමරිකානු ඩොලර් මිලියන 27.8 ක වටිනාකමක් හා පොලියක් දක්වා තිබුණි. | හෙජිං ගනුදෙනුව සම්බන්ධයෙන් මහජන බැංකුව විසින් ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට එරෙහිව කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොමැත. | මෙම කාරණය කඩිනමින් විසඳීම සඳහා අවශ්‍ය පියවර ගත යුතුය. |

**3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ)සංස්ථාවේ ලිහිසි තෙල් නිෂ්පාදනයන්ගේ විකුණුම් පරිමාව සහ විකුණුම් වටිනාකම ක්‍රමයෙන් පහත වැටී ඇති බව නිරීක්ෂණය විය. තවද ශ්‍රී ලංකාවේ මහජන උපයෝගිතා කොමිෂන් සභාවේ වාර්තාවට අනුව, සංස්ථාවේ ශ්‍රී ලංකා ලිහිසි තෙල් වෙළඳපොලේ වෙළඳපල කොටස සහ වෙළඳපල ස්ථානය ද ක්‍රමයෙන් පිරිහී ගොස් ඇත. 2019 තුන්වන කාර්තුව වනවිට සංස්ථාවේ වෙළඳපල ස්ථානය 5 වන ස්ථානයේ සිට 6 වන ස්ථානය දක්වා ක්‍රමයෙන් පිරිහී තිබුණි. කෙසේ වෙතත්, සංස්ථාවේ ලිහිසි තෙල් අලෙවියේ ශුද්ධ ලාභය වැඩිවී තිබුණි. එබැවින්, ලිහිසි තෙල් ව්‍යාපාරය ශ්‍රී ලංකාවේ ලාභදායී ව්‍යාපාරයක් වන නමුත් ඒ සඳහා සංස්ථාව අඩු අවධානයක් යොමු කර ඇති බව පෙනුනි. | ලිහිසි තෙල් විකුණුම් පරිමාව 2016 සිට අඩු වී ඇති අතර වෙළඳපල ස්ථානය ද 5 සිට 6 දක්වා පහත වැටී ඇති අතර වෙළඳපල කොටස 6% ට වඩා අඩු මට්ටමක පවතී. කෙසේ වෙතත්, රටේ සමස්ත වෙළඳපල පරිමාව සෙමෙන් වැඩි වී තිබේ. ඛනිජ තෙල් නීතිගත සංස්ථාව සහ එම් / එස් හයිරැක්ස් ඔයිල් එස්ඩීඑන් බීඑච්ඩී (M/S Hyrax Oil Sdn Bhd). අතර ඇති කර ගත් ගිවිසුම් පිළිබඳ වසරක පමණ කාලයක් පවතින මතභේදාත්මක තත්ත්වය මෙම විකුණුම් පරිමාව අඩුවීමට හේතු විය. මෙම අවිනිශ්චිත තත්ත්වය නිසා ඇණවුම් ලබා ගැනීම ප්‍රමාද වී ඇත.<br>ඉහත 1 හි අදහස් දැක්වීම් වලට අමතරව, ශුද්ධ ලාභ ප්‍රතිශතය තරමක් වැඩි වී තිබේ. ඛනිජ තෙල් නීතිගත සංස්ථාව විසින් අලෙවි | ලිහිසි තෙල් ව්‍යාපාරය වැඩි දියුණු කිරීම සඳහා සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය. |

කරන ලිහිසි තෙල් නිෂ්පාදන සඳහා ඉල්ලුමක් පවතී. ඛනිජ තෙල් නීතිගත සංස්ථාව සහ එම් / එස් හයිරැක්ස් ඔයිල් එස්ඩීඑන් බීඑච්ඩී (M/S Hyrax Oil Sdn Bhd) අතර මතභේදාත්මක තත්ත්වය හේතුවෙන් අනුමත කිරීමේ ක්‍රියා පටිපාටියේ ඇති වූ බාධාවන් සහ ප්‍රමාදයන් හේතුවෙන් විශ්වාසවන්ත ගනුදෙනුකරුවන් සඳහා ප්‍රමාණවත් නිෂ්පාදන වෙළඳපොලේ නොතිබුණි. ලිහිසි තෙල් ව්‍යාපාරය යනු ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට ආයෝජනය කිරීමට හා සංවර්ධනය කිරීමට ඇති ප්‍රධාන ක්ෂේත්‍රයක් බව පැහැදිලි ය. ගිවිසුම්වල අදාළ ක්ෂේත්‍ර හඳුනා ගැනීමෙන් පසු කළමනාකාරිත්වයට අවශ්‍ය වූයේ සීපෙට්කෝ වෙළඳ නාමය යටතේ ලිහිසි තෙල් නිෂ්පාදන නිෂ්පාදනය හා අලෙවිකරණය කිරීමට පෙර ඒවා නිවැරදි කිරීමට ය.

(ආ) සංස්ථාව විසින් කළමනාකරණය කරනු ලබන, රටේ සියලුම ප්‍රදේශ ආවරණය වන පිරවුම්හල් 1,200 කට වඩා අධික ඉහළම විකුණුම් ජාලයක් සංස්ථාව සතුව ඇත. මීට අමතරව, ප්‍රවාහන ක්‍රමය, බිල් කිරීමේ ක්‍රියාවලිය, තොග පාලනය සහ ලිහිසි තෙල් ව්‍යාපාරයේ සමස්ත ක්‍රියාකාරිත්වය අධීක්ෂණය කිරීම අවම ප්‍රයත්නයකින් හා පිරිවැයකින් සංස්ථාවේ දැනට ස්ථාපිත ඉන්ධන ගබඩා හා බෙදාහැරීමේ ජාලයට අනුකූලව පහසුවෙන් කළමනාකරණය කළ හැකිය. ත්‍රිවිධ හමුදාව, පොලීසිය, විදුලිබල මණ්ඩලය, ජල සම්පාදන මණ්ඩලය, මාර්ග සංවර්ධන අධිකාරිය, දුම්රිය දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය වැනි ලිහිසි තෙල් නිෂ්පාදන බහුලව භාවිතා කරන රාජ්‍ය ආයතන ඇතුළු රාජ්‍ය ආයතනවල ලිහිසි තෙල් සැපයුම්කරු වීමට රාජ්‍ය ආයතනයක් ලෙස සංස්ථාවට වැඩි අවස්ථාවක් තිබේ. ශ්‍රී ලංකාවේ ලිහිසි තෙල් නිෂ්පාදන ගබඩා කිරීම හා සැපයීම සම්බන්ධයෙන් සියලු යටිතල පහසුකම් සංස්ථාව විසින් සංවර්ධනය කර ඇත. මීට අමතරව, සංස්ථාව විසින් හයිරැක්ස් ඔයිල් එස්ඩීඑන් බීඑච්ඩී (එච්ඕඑස්බී) (M/S Hyrax Oil Sdn Bhd) සමඟ ශ්‍රී ලංකාවේ ලිහිසි තෙල් මිශ්‍ර කිරීමේ කම්හලක් ගොඩනැගීම, ක්‍රියාත්මක කිරීම සහ මාරු කිරීම (BOT)

2020 අප්‍රේල් මාසයේදී එම් / එස් හයිරැක්ස් (M/S Hyrax Oil Sdn Bhd) විසින් ඉදිකරන ලද සහ ක්‍රියාත්මක කරන ලද නව ලිහිසි තෙල් කම්හලේ වාණිජ නිෂ්පාදනය ක්‍රමයෙන් ආරම්භ කරන ලදී. කොවිඩ් -19 වසංගත තත්ත්වය නිෂ්පාදන කම්හල් සේවකයින්ගේ පැමිණීමේ ප්‍රමාදයක් ඇති කළ අතර එම් / එස් හයිරැක්ස්හි පර්යන්ත ක්‍රියාකරුට අනුව අනුව අමුද්‍රව්‍ය සැපයුම් දාමයේ බාධා හේතුවෙන් ගැටළු කිහිපයක් ඇති විය.

2020 ජූලි මාසයේ සිට, ප්‍රාදේශිය කළමනාකරුවන්ගේ සහ අදාළ ප්‍රාදේශිය අධීක්ෂකවරුන්ගේ ඍජු අධීක්ෂණය යටතේ පිරවුම්හල් 1200 හරහා ලිහිසි තෙල් අලෙවිකිරීමට කළමනාකරණය සැලසුම් කරන ලදී. තවද, ශ්‍රී ලංකා වෙළෙඳපොළ තුළ තරඟකාරිත්වය වැඩි දියුණු කිරීම සඳහා නව පර්යන්තයේ නිෂ්පාදනය කරන සීපෙට්කෝ ලිහිසි තෙල් මිල සැලකිය යුතු ලෙස අඩු කරන ලදී. නව මිල ගණන් 2020 අගෝස්තු 1 වන දින ප්‍රකාශයට පත් කරන ලද අතර නිෂ්පාදන හිඟයකින් තොරව ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ පිරවුම්හල් වෙත සැපයුම් තබා ගැනීමට තොග ජාලය උනන්දු විය.

මේ අතර, රජයේ සංස්ථා සහ අනෙකුත් රජයේ ආයතන සඳහා 20% ක ආයතනික

ලිහිසි තෙල් ව්‍යාපාරයේ කාර්යක්ෂමතාව සහ ඵලදායිතාවය වැඩි කිරීම සඳහා සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය.

| | | |
|---|---|---|
| පදනම යටතේ 2016 මැයි 06 දින වසර 20 ක කාලයක් සඳහා ගිවිසුමක් අත්සන් කර තිබුණි. තවද, වෙනම කල්බදු ගිවිසුමක් සහ සැපයුම් ගිවිසුමක් (HOSB වෙතින් නිෂ්පාදන මිලදී ගැනීමට හැකි) සංස්ථාව විසින් එදිනම HOSB සමඟ අත්සන් කර තිබුණි. ලිහිසි තෙල් කම්හලේ ඉදිකිරීම් කටයුතු අවසන් කර 2019 ජුනි 24 වන දින උත්සවාකාරයෙන් විවෘත කර තිබුණි. කෙසේ වෙතත්, සංස්ථාව මෙහෙයුම් කටයුතු උපාය මාර්ගික ව්‍යාපාර සැලැස්මක් සමඟ ආරම්භ කර නොතිබුණි. | වට්ටමක් ලබා දෙන ලදී. වර්තමානයේදී ශ්‍රී ලංකා හමුදාව, ශ්‍රී ලංකා නාවික හමුදාව, විශේෂ කාර්යය බලකාය, ශ්‍රී ලංකා ගමනගමන මණ්ඩලය සහ අනෙකුත් රජයේ ආයතන ලිහිසි තෙල් නිෂ්පාදන සඳහා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට සමඟ කටයුතු කරයි. ඛනිජ තෙල් නීතිගත සංස්ථාව මේ වන විට සිය අලෙවිකරණ කටයුතු සිදු කරන්නේ, මසකට ලීටර්/කිලෝ මිලියන 1ක පමණ විකුණුම් පරිමාවක් එනම් 2020 දෙසැම්බර් වනවිට 20%ක වෙළඳපල කොටසක් ළඟා කර ගැනීමේ අරමුණෙනි. | |
| (ඇ) ප්‍රසම්පාදන ක්‍රියාවලිය සම්පූර්ණ කිරීමේදී සැලකිය යුතු ප්‍රමාදයක් නිරීක්ෂණය විය. එහි ප්‍රතිපලයක් ලෙස ගබඩාවේ තොග නොමැතිවීම, වෙළඳපොලේ ලිහිසි තෙල් සහ ග්‍රීස් නිෂ්පාදන හිඟය සහ තරගකාරී සමාගම් සමඟ ගනුදෙනුකරුවන් ආකර්ෂණය කර ගැනීමේදී ඇති හැකියාව නිරීක්ෂණය විය. | අමාත්‍ය මණ්ඩලය පත් කල ප්‍රසම්පාදන කමිටුවේ ආවරණ අනුමැතිය ලබා ගැනීම සඳහා ගිවිසුම් සකස් වෙමින් පවතින අතර, වෙළඳපල අවශ්‍යතාවයට අතිරේකව කුඩා ඇණවුම් බාර ගනු ලැබේ. ග්‍රීස්, බ්‍රේක් ඔයිල් සහ සිසිලනකාරක M/S Hyrax විසින් ආනයනය කරනු ලබන අතර CPC විසින් ක්‍රියාත්මක කරනු ලබන නව මිශ්‍රණ යන්ත්‍රාගාරය මගින් අනෙකුත් සියලුම ලිහිසි තෙල් නිෂ්පාදන දේශීයව නිෂ්පාදනය කරනු ලැබේ. | ප්‍රසම්පාදන ක්‍රියාවලිය කාර්යක්ෂම කිරීම සඳහා සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ඈ) මුතුරාජවෙල පර්යන්තයේ ප්‍රධාන ගබඩාව ඇතුළුව ලිහිසි තෙල් ගබඩා 04 ක් ඇත. කෙසේ වෙතත්, එක් එක් නිෂ්පාදනයේ තොග මට්ටම් ඇතුළු නිසි වාර්තා තොග අංගනවල පවත්වා ගෙන ගොස් නැත. විගණන පරීක්ෂණයේ දී අවිධිමත් ලෙස ගබඩා කර ඇති තොග, උෂ්ණත්වය වැනි පාරිසරික සාධක සැලකිල්ලට නොගෙන ගබඩා කර ඇති තොග සහ හානියට පත් විශාල ලිහිසි තෙල් තොග නිරීක්ෂණය කරන ලදී. තවද, 2018 ඔක්තෝම්බර් මාසයේදී සිදු කරන ලද විශේෂ භෞතික තොග සත්‍යාපනයේදී හඳුනාගන්නා ලද රු. මිලියන 6 කට වැඩි තොග අලාභ හඳුනා ගැනීමට පියවර ගෙන නොමැත. | ලිහිසි තෙල් නිෂ්පාදන ගබඩා කිරීම සඳහා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව විසින් නඩත්තු කරනු ලබන්නේ එක් ලිහිසි තෙල් ගබඩාවක් පමණි. පිරවුම්හල්වල ඉල්ලුම සපුරාලීම සඳහා ප්‍රමාණවත් තොග නඩත්තු කළ යුතුය. මුතුරාජවෙල හි ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ ගබඩාව පාලිත උෂ්ණත්වයන් යටතේ ආරක්ෂිත ගබඩා පහසුකම් වලින් සමන්විත වන අතර එහි බිත්ති වටා අධි කාර්මික විදුලි පංකා සවි කර ඇත. සුදුසුකම්ලත් කාර්ය මණ්ඩලයක් විසින් ගබඩාව හසුරුවන අතර ෆොර්ක්ලිෆ්ට් සහ නිර්මාණය කරන ලද තොග තලයන් භාවිතා කරයි. සඳහන් කර ඇති තොග අලාභයට හේතු වී ඇත්තේ හානියට පත් තොග, අබලි වූ තොග සහ අනෙකුත් මාර්ගස්ථ තොග වේ. මෙය අධ්‍යයනය කර ඇති අතර නැවත සකස් කිරීම සඳහා තවත් අබලි වූ නිෂ්පාදන තොගයක් නව මිශ්‍රණ කම්හල වෙත යැවීමට නියමිතය. | නිසි වාර්තා පවත්වා ගත යුතු අතර හානිය අවම වන පරිදි තොග හැසිරවිය යුතුය. |

| | | |
|---|---|---|
| (ඉ)පෙර වර්ෂයේ වාර්තාවල සඳහන් පරිදි, ලංකා විදුලි බල මණ්ඩලය ඇතුළු ප්‍රධාන ගනුදෙනුකරුවන් 13 දෙනෙකු සමඟ ඉන්ධන සැපයුම සඳහා විධිමත් ගිවිසුම් අත්සන් කර නොතිබූ අතර, සමාලෝචිත වර්ෂය අවසානයේදී එම ආයතනයන්ගෙන් අයවිය යුතු මුළු මුදල රුපියල් මිලියන 91,722 ක් විය. | සමහර ගිවිසුම් කෙටුම්පත් ආකෘතින්ගෙන් පවතින අතර තවමත් එම ගිවිසුම් සකස් කර අවසන් වී නොමැත. සමහර ගනුදෙනුකරුවන්ගේ ගෙවීම් මහා භාණ්ඩාගාරය හරහා යවනු ලැබේ. | ප්‍රධාන ගනුදෙනුකරුවන් සමඟ විධිමත් ගිවිසුම් ඇති කර ගැනීම සඳහා සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ඊ) ඛනිජ තෙල් නිෂ්පාදන ගබඩා කිරීම හා බෙදා හැරීම<br>ශ්‍රී ලංකාවේ දැනට භාවිතා වන ඛනිජ තෙල් ගබඩා ධාරිතාවේ ප්‍රමාණවත් බව ඇගයීම පිලිබඳ මාගේ විශේෂ වාර්තාව තුලින්, ශ්‍රී ලංකාවේ දැනට ක්‍රියාත්මක වන ඉන්ධන ප්‍රවාහන නල පද්ධතිය, දුම්රිය හා බවුසර් ප්‍රවාහන පද්ධතියේ යෝග්‍යතාවය හා ඵලදායිතාව ඇගයීමට ලක් කිරීම සහ ඒ සඳහා ගත යුතු ක්‍රියාමාර්ග පිළිබඳ නිර්දේශ ඉදිරිපත් කර ඇත. රටේ ඛනිජ තෙල් ගබඩා සංකීර්ණයේ හා ඉන්ධන ප්‍රවාහන පද්ධතිය සුමටව හා ආරක්ෂිතව ක්‍රියාත්මක කිරීම සඳහා නිර්දේශ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද අතර මෙම වාර්තාව ශ්‍රී ලංකා ජාතික විගණන කාර්යාලයේ නිල වෙබ් අඩවියෙන් ලබා ගත හැකිය. | - | විශේෂ වාර්තාවේ දක්වා ඇති නිර්දේශ ක්‍රියාත්මක කිරීම කෙරෙහි වහාම අවධානය යොමු කළ යුතුය. |
| (උ)ත්‍රිකුණාමලය තෙල් ටැංකි සංකීර්ණය.<br>මෙම තෙල් ටැංකි සංකීර්ණය 1930 වර්ෂයේ දී ඉදිකරණ ලද අතර ඝන මීටර් 12,500 (m3) (මෙට්‍රික් ටොන් 10,000) බැගින් වන තෙල් ටැංකි 100 කින් සහ ඊට සම්බන්ධ අනෙකුත් පහසුකම් වලින් සමන්විත වේ. ටැංකි සංකීර්ණයට අයත් හෙක්ටයාර් 358.553ක භූමි ප්‍රමාණය, ශ්‍රී ලංකාවට නිදහස ලැබීමට පෙර වසර 999ක කාලයක් සඳහා ශ්‍රී ලංකා රජය විසින් බ්‍රිතාන්‍ය රජයේ අධි අද්මිරාල් ස්වාමිවරයාගේ කොමසාරිස්වරුන්ට බදු පදනම මත ලබා දී ඇත. 1961 දී ශ්‍රී ලංකා රජයේ ඉල්ලීම පරිදි සංස්ථාව වාරික තුනකින් ස්ටර්ලිං පවුම් 250,000 ක් ගෙවා 1964 අප්‍රේල් 01 දින සිට බලපැවැත්වෙන පරිදි ඉඩම්, ගොඩනැගිලි, තෙල් ටැංකි සංකීර්ණය, සහ වෙනත් උපකරණ වල හිමිකම පවරාගෙන තිබුණ ද , ඉහත ඉඩම සඳහා රජයෙන් මේ දක්වා කිසිදු නීතිමය ලියවිල්ලක් ලබාගෙන නොතිබුණි. | 1963 දෙසැම්බර් හෝ ඊට ආසන්න දිනකදී රජය විසින් බ්‍රිතාන්‍ය රජය සමඟ තෙල් ස්ථාපන පරිශ්‍රයේ ගොඩනැගිලි සහ උපකරණ සඳහා ස්ටර්ලිං පවුම් 250,000 ක මුදලකට ගිවිසුමක් අත්සන් කරන ලදී. මෙම මුදල වාරික තුනකින් ඛනිජ තෙල් නීතිගත සංස්ථාව විසින් ගෙවා ඇත.<br>ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට මේ දක්වා කිසිදු හිමිකාරිත්ව ලේඛනයක් ලැබී නොමැත. | ටැංකි සංකීර්ණයේ හිමිකාරිත්වය නිරවුල් කිරීම සහ ටැංකි සංකීර්ණයේ ඇති සම්පත් භාවිතා කරමින් ඛනිජ තෙල් ආශ්‍රිත ව්‍යාපාර ආරම්භ කිරීම කෙරෙහි වහාම අවධානය යොමු කළ යුතුය. |

2003 දී ශ්‍රී ලංකා රජය විසින් ලංකා ඉන්දියානු තෙල් සමාගම (LIOC) සහ සංස්ථාව සමඟ ගබඩා පහසුකම් සහ ඉඩම වසර 35 ක කාලයක් සඳහා LIOC වෙත බදු දීමට ගිවිසුමක් අත්සන් කර ඇති අතර සහ එම ගිවිසුම් ගත දින සිට මාස 6 ක් තුළ කල්බදු ගිවිසුම ක්‍රියාත්මක කළ යුතුව තිබුණි . සංස්ථාව මේ දක්වා කිසිදු කල්බදු ගිවිසුමකට එළඹ නොමැති අතර ටැංකි සංකීර්ණය ද භාවිතා කර නොමැත. කෙසේ වෙතත්, LIOC ආයතනය විසින් 2003 සිට එම වත්කම් භාවිතා කරයි.

(ඍ) තොග සමාලෝචන කමිටුව

පෙර විගණන වාර්තාවල සඳහන් පරිදි, සංස්ථාවෙහි, ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගමෙහි (CPSTL), ජේසීටී(JCT) තෙල් බැංකුවෙහි, ලංකා ඉන්දියානු තෙල් සමාගමෙහි (LIOC), ලංකා විදුලි බල මණ්ඩලයෙහි (CEB) සාමාජිකයින් සහ රේඛීය අමාත්‍යාංශයේ නිලධාරියෙකුගෙන් තොග සමාලෝචන කමිටුව සමන්විත වූ අතර එහි රැස්වීම් සෑම සතියකම පවත්වනු ලැබේ. කෙසේ වෙතත්, එක් එක් ඛනිජ තෙල් නිෂ්පාදන සඳහා තොග මට්ටම්, එනම් නැවත ඇණවුම් මට්ටම, උපරිම හා අවම තොග මට්ටම් සහ නැවත ඇණවුම් ප්‍රමාණය යනාදිය පිළිබඳව සංස්ථාව නිසි වාර්තා පවත්වා ගෙන ගොස් නොමැත. ඛනිජ තෙල් නිෂ්පාදනවල ඇණවුම් ප්‍රමාණය තීරණය කරනු ලබන්නේ ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගම (CPSTL) විසින් ඉදිරිපත් කරන ලද තොග ප්‍රමාණ නඩත්තු වාර්තාව මත පදනම්ව වන අතර ඛනිජ තෙල් නිෂ්පාදන තොග නඩත්තු කිරීම පිළිබඳ වෙනත් ලියකියවිලි තොග සමාලෝචන කමිටුවට ඉදිරිපත් කර නොමැත. කෙසේ වෙතත්, 2010 දී SAP ක්‍රමය හඳුන්වා දුන් දින සිට, තොග අවශ්‍යතාවය පිළිබඳ වාර්තා ඉදිරිපත් කිරීම සඳහා දත්ත උපුටා ගැනීමට සංස්ථාවට නොහැකි වූ බව අනාවරණය විය. ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගම විසින් ඉදිරිපත් කරන ලද තොග ප්‍රමාණ නඩත්තු වාර්තාවට අමතරව, පසුගිය වසර තුන තුළදී SAP පද්ධතියේ ඇති තොග දත්ත ද සැලකිල්ලට ගනු ලබන අතර විකුණුම් තොරතුරු සංස්ථාවෙහි අලෙවිකරණ කළමනාකරු සපයනු ලබයි. එමෙන්ම, සංස්ථාවේ මූල්‍ය අංශය විසින් සපයනු ලබන ලංකා ඉන්දියානු තෙල් සමාගමෙහි හි තොග සත්‍යාපන දත්ත සහ තොගය ප්‍රමාණවත් දින ගණන් සලකා බලනු ලැබේ. තොග පිළිබඳ නිසි වාර්තා සංස්ථාව විසින් පවත්වාගෙන යා යුතුය.

(එ) සපුගස්කන්ද තෙල් පිරිපහදුව

පෙර විගණන වාර්තාවල සඳහන් පරිදි, දශක පහකට පෙර ඉදිකරන ලද (1969 දී ආරම්භ කරන ලද) දැනට පවතින පිරිපහදුව මූලික මට්ටමේ පිරිපහදුවක් වන අතර, රට තුළ 2018 සහ 2019 වර්ෂවල දී පිරිපහදුව සංවර්ධනය කිරීම සඳහා ආයෝජකයින් කිහිප දෙනෙකු ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ කළමනාකාරිත්වයට ප්‍රවේශ වූ දැනට පවතින පිරිපහදුව වැඩිදියුණු කිරීම සඳහා මෙන්ම, අඩු පිරිවැයකින් රටේ

| | | |
|---|---|---|
| වැඩිවෙමින් පවතින ඛනිජ තෙල් නිෂ්පාදනවල ඉල්ලුම සපුරාලීමට මෙය ප්‍රමාණවත් නොවේ. අඩු පිරිවැයකින් ඛනිජ තෙල් නිෂ්පාදන නිපදවීමේ පහසුකම් සහිත, පහළ මට්ටමේ නිෂ්පාදන, පෙට්‍රල් සහ ඩීසල් වැනි ඉහළ වටිනාකමකින් යුත් නිෂ්පාදන දක්වා ඉහළ නැංවීමේ හැකියාව සහිත සහ එමගින්, එහි මෙහෙයුම් කාර්යක්ෂමතාව උපරිම කරනු ලබන උසස් තාක්ෂණයන්ගෙන් ක්‍රියාත්මක වන පිරිපහදු සමඟ සසඳන විට, මෙම පිරිපහදුව අඩු ආන්තිකයකින් ක්‍රියාත්මක වේ. කෙසේවෙතත්, ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට එහි නිෂ්පාදන වෙළඳපොළට සැපයීම පිරිවැය ඵලදායී ආකාරයෙන් සිදු කිරීම සඳහා, යෝජිත සපුගස්කන්ද තෙල් පිරිපහදුව පුළුල් කිරීමේ හා නවීකරණය කිරීමේ (SOREM) ව්‍යාපෘතිය හෝ විකල්ප ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීමට නොහැකි වී තිබුණි. තවද, එකී අරමුණ සඳහා රුපියල් මිලියන 1,003 ක පිරිවැයකට අත්පත් කර ගත් ඉඩම මෙම වාර්තාවේ දිනය දක්වාම නිශ්කාර්යව පැවතුණි. | නමුත්, අවසන් ක්‍රියාත්මක කිරීමේ යෝජනාව තවම තහවුරු කර නොමැත. ව්‍යාපෘති ප්‍රමාදය සඳහා ප්‍රධාන වශයෙන් අරමුදල් ප්‍රමාණවත් නොවීම හේතු විය.<br>මීට පෙර SOREM ව්‍යාපෘතිය සඳහා තෝරා ගනු ලැබූ වර්තමානය වන විට නිෂ්කාර්යව පවතින අක්කර 35 ක ඉඩම, රටේ අවශ්‍යතා සපුරාලීම සඳහා පිරිපහදුවක් ඉදිකිරීමට ආයෝජකයෙකු තෝරා ගෙන සිටී නම් භාවිතා කළ හැකි බව හඳුනා ගෙන ඇති අතර, බොහෝ දුරට SOREM සැලැස්මට සාපේක්ෂව අවශ්‍ය පිරිපහදු ධාරිතාව වර්තමානය වන විට ඉහළ මට්ටමක පවතින බැවින්, අවසාන වශයෙන් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අමතර ඉඩම් අත්පත් කර ගැනීම අවශ්‍ය වනු ඇත. | ඉල්ලුම සපුරාලීම සඳහා නව පිරිපහදුවක් ඉදිකිරීම සඳහා ද වැඩි අවධානයක් යොමු කළ යුතුය. |

## 3.3 නිෂ්කාර්ය හෝ ඌණ උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) වනාතමුල්ලේ පිහිටි හල්ගහකුඹුර ඉඩම - එල්පී ගෑස් ව්‍යාපෘතිය සහ ක්‍රීඩා භූමියක් සඳහා රු.මිලියන 10.6 කට මෙම ඉඩම අත්කර ගෙන තිබුණි. එසේ වුවත්, මෙම ඉඩම අදාළ අභිමතාර්ථය සඳහා යොදාගෙන නොතිබුණු අතර එය අනවසර පදිංචිකරුවන් 700 කට වැඩි පිරිසක් විසින් තම අවශ්‍යතා සඳහා යොදා ගෙන තිබුණි. | අපි මෙම ප්‍රකාශය සමග එකඟ වෙමු.<br>පවුල් 700 කට වැඩි පිරිසකට නිවාස වෙන් කිරීමට ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට හැකියාවක් නැත. සියලුම පදිංචිකරුවන් ඉවත් කිරීමට මහේස්ත්‍රාත් අධිකරණයේ පියවර ගත හැකිය. නමුත් නෙරපා හැරීමේදී ඇතිවිය හැකි සමාජ බලපෑම හේතුවෙන් අදාළ අමාත්‍යාංශ සමඟ සාකච්ඡා කරන ලෙස නීතිපතිවරයා දන්වා තිබේ.<br>ඛනිජ තෙල් අමාත්‍යාංශය හරහා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව විසින් ඉඩම භාර දී රජයේ තක්සේරුවක් මත ගෙවීමක් ලබා ගැනීමට උත්සාහ කළද එය අසාර්ථක විය. | රජයේ ඉඩම් (අත්පත් කර ගැනීමේ) පනතේ සඳහන් කර ඇති විධිවිධාන අනුව අනවසර පදිංචිකරුවන් ඉවත් කිරීමට පියවර ගත යුතුය . |

| | | |
|---|---|---|
| (ආ) මාහේන ඉඩම - ලබා ගත හැකි වූ ලියවිලි අනුව, සංස්ථාව විසින් මෙම ඉඩම අත්පත් කර ගැනීම සඳහා රු. මිලියන 0.625ක මුදලක් ගෙවා තිබුණි. කෙසේ වුවද, මෙම ඉඩම සංස්ථාවේ පොත්වල ගිණුම්ගත කර නොතිබුණි. කෙසේ වුවද 1986 වර්ෂයේ සිට එය පෙර අයිතිකරු විසින් භාවිතා කරමින් පැවතුණි. | මාහේන ඉඩමේ ප්‍රමාණය පර්චස් 21.18 කි. කොලොන්නාව ප්‍රාදේශීය ලේකම් විසින් මෙම ඉඩමෙන් කැබලි 06 ක් ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට භාර දී ඇත. කොලොන්නාව ප්‍රාදේශීය ලේකම් විසින් පදිංචිකරුවන් ඉවත් කිරීමට පියවර ගෙන ඇති අතර, එය ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට භාරදීමට කටයුතු කර තිබේ. | අනවසර පදිංචිකරුවන් ඉවත් කිරීමට සහ දේපළ සංස්ථාවේ අභිවෘද්ධිය සඳහා යොදා ගැනීමට නීතිමය ක්‍රියාමාර්ග ගත යුතුය. |